# මත්ද්‍රව්‍ය භාවිතයෙහි ව්‍යාප්තිය සහ නූතන ප්‍රවණතා පිළිබඳ අධ්‍යයනය



පර්යේෂණ අංශය

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය
නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය

# මත්ද්‍රව්‍ය භාවිතයෙහි ව්‍යාප්තිය සහ නූතන ප්‍රවණතා පිළිබඳ අධ්‍යයනය - 2016/2017


**හද්‍රානි සේනානායක**

**තමර දර්ශන**

**සහාය පර්යේෂක කණ්ඩායම**

**හිරුණි වත්සලා**

**සුපුන් ප්‍රියදර්ශන**

**නිලුක්ෂි තිසේරා**

**පර්යේෂණ අංශය**

**අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය**

**නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය**

# පටුන


හැඳින්වීම ........................................ 5

පර්යේෂණ පසුබිම ........................................ 6

පර්යේෂණ ගැටලුව ........................................ 9

පර්යේෂණ අරමුණු ........................................ 9

පර්යේෂණ ක්‍රමවේදය ........................................ 10

පර්යේෂණ ක්‍රමය සහ දත්ත රැස් කිරීමේ ශිල්ප ක්‍රම ........................................ 10

පර්යේෂණ ක්ෂේත්‍රය සහ නියැදිය තෝරා ගැනීම ........................................ 11

නියැදිය තුළ මත්ද්‍රව්‍ය භාවිතයෙහි සංයුතිය හා උපනතීන් ........................................ 13

දත්ත දායකයින්ගේ ප්‍රජා හා සමාජ විද්‍යාත්මක පැතිකඩ ........................................ 17

මත්ද්‍රව්‍ය භාවිතය සහ ප්‍රජා හා සමාජ විද්‍යාත්මක සාධක අතර සම්බන්ධතාවය ........................................ 19

ස්ත්‍රී පුරුෂ භාවය සහ මත්ද්‍රව්‍ය භාවිතය ........................................ 20

මත්ද්‍රව්‍ය භාවිතය සහ වයස් මට්ටම් ........................................ 20

ජන වර්ගය සහ මත්ද්‍රව්‍ය භාවිතය ........................................ 22

අධ්‍යාපන මට්ටම සහ මත්ද්‍රව්‍ය භාවිතය ........................................ 24

විවාහක අවිවාහක බව සහ මත්ද්‍රව්‍ය භාවිතය ........................................ 26

රැකියාව සහ මත්ද්‍රව්‍ය භාවිතය ........................................ 28

ප්‍රතිඵල ........................................ 29

මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය ........................................ 29

හෙරොයින් භාවිතයේ ව්‍යාප්තිය සහ ඒ ආශ්‍රිත කාලීන තත්ත්වය ........................................ 29

හෙරොයින් වෙනුවට භාවිතා කරන විකල්ප මත්ද්‍රව්‍ය ........................................ 32

හෙරොයින් වල මිල ගණන් සහ ලබා ගැනීමට ඇති අවකාශය ........................................ 32

ගංජා භාවිතයේ ව්‍යාප්තිය සහ ඒ ආශ්‍රිත කාලීන තත්ත්වය ........................................ 33

පෙති වර්ග භාවිතය පිළිබඳ තත්ත්වය ........................................ 34

සිගරැට්, නීත්‍යානුකූල මද්‍යසාර සහ නීතිවිරෝධී මද්‍යසාර භාවිතය සම්බන්ධ තොරතුරු ........................................ 35

පවුල් ව්‍යුහය තුළ මත්ද්‍රව්‍ය භාවිතයේ තත්ත්වය ........................................ 36

මත්ද්‍රව්‍ය භාවිතය සහ සෞඛ්‍යමය පැතිකඩ ........................................ 36

මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදි සම්බන්ධයෙන් වරදකරුවන් වීමේ ප්‍රවණතාව ........................................ 37

මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය සම්බන්ධ දත්ත දායකයින්ගේ මත විමසුම ........................................ 38

බහුලවම භාවිතා කරන මත්ද්‍රව්‍ය/මත්පැන් වර්ග (Mostly Abused Drugs) සම්බන්ධ ප්‍රතිචාර ........................................ 39

වඩාත් ගැටලුකාරී මත්ද්‍රව්‍ය හා මත්පැන් (most problematic drugs) සම්බන්ධ ප්‍රතිචාර ........................................ 40

පහසුවෙන්ම ලබාගත හැකි මත්ද්‍රව්‍ය වර්ග (Easily accessible drugs) සම්බන්ධ ප්‍රතිචාර ........................................ 42

මත්ද්‍රව්‍ය භාවිතය ආශ්‍රිත නූතන ප්‍රවණතා ........................................ 44

අදාළ ප්‍රදේශ තුළ අනුගාමී මාස 03 ක හෙරොයින්, ගංජා සහ නීතිවිරෝධී මද්‍යසාර සම්බන්ධ අත්අඩංගුවට ගැනීම් පිළිබඳ තත්ත්වය ........................................ 44

වෛද්‍යමය අරමුණු සඳහා නිර්දේශිත ඖෂධ වර්ග අනිසි භාවිතය සම්බන්ධ ප්‍රවණතා ........................................ 46

පාසල් ළමුන් අතර මත්කාරක ද්‍රව්‍යයන් ව්‍යාප්ත වීම හා සම්බන්ධ ප්‍රවණතා....................................48
මත්ද්‍රව්‍ය දුර්භාවිතය සම්බන්ධ සිද්ධීන් වල ස්ත්‍රී පුරුෂ නියෝජනය ..............................................49
නිගමන...........................................................................................................................50
යෝජනා .........................................................................................................................52
ආශ්‍රිත ග්‍රන්ථ.....................................................................................................................52

## සංක්ෂිප්තය


මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය සහ ඒ ආශ්‍රිතව මතුව ඇති නූතන ප්‍රවණතා හඳුනාගැනීමේ අරමුණින් දිවයිනේ තෝරාගත් පොලිස්බල ප්‍රදේශ 28 ක් ඇසුරින් මෙම අධ්‍යයනය ක්‍රියාත්මක කර ඇත. හිමබෝල නියැදි ක්‍රමය භාවිත කරමින් දත්ත දායකයින් 1079 ක් අධ්‍යයනයට සම්බන්ධ කරගෙන ඇති අතර දැනට කුමන හෝ මත්ද්‍රව්‍ය වර්ගයක් භාවිත කරන පුද්ගලයින් මේ සඳහා තෝරා ගෙන ඇත. දත්ත රැස්කිරීම සඳහා ප්‍රධාන වශයෙන් ප්‍රශ්නාවලි ක්‍රමය භාවිත කර ඇති අතර ඊට අමතරව එක් එක් අධ්‍යයන ප්‍රදේශ වලින් අරමුණු සහගතව තෝරා ගන්නා ලද මූලික තොරතුරු සපයන්නන් සමග කරන ලද සම්මුඛ සාකච්ඡා මගින් මත්ද්‍රව්‍ය භාවිතය හා සම්බන්ධ නූතන ප්‍රවණතා පිළිබඳ ගුණාත්මක දත්ත රැස්කරන ලදි.

අධ්‍යන අනාවරණයන්ට අනුව අන්තරායකර ඖෂධ ගණයට ගැනෙන මත්කාරක ද්‍රව්‍ය භාවිතා කරන පුද්ගලයින්ගේ මත්ද්‍රව්‍ය භාවිත රටා අනුව බහුතරයක් පිරිස බහුවිධ මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන් (Multiple drug users) වූහ. මත්ද්‍රව්‍ය භාවිතයට මුලින්ම යොමු වන වයස් සීමාව පිළිබඳව සැළකීමේදී බහුතරයක් පුද්ගලයින් වයස අවුරුදු 15ත් 19ත් අතර වයස් මට්ටමකදී ප්‍රථම වරට යම් මත්ද්‍රව්‍යයක් භාවිතා කිරීමට යොමුවී ඇත.

හෙරොයින් භාවිතා කරන ජනගහනය අතර මත්ද්‍රව්‍ය ශරීරගත කර ගන්නා ප්‍රචලිත ක්‍රමය බවට පත්ව ඇත්තේ, චයිනීස් (chase to the Dragon) ක්‍රමයයි. හෙරොයින් භාවිතා කරන පුද්ගලයින් දිනකට හෙරොයින් භාවිතා කරන සාමාන්‍ය වාර ගණන 03 ක් වන අතර හෙරොයින් භාවිතා කරන පුද්ගලයෙක් දිනකට භාවිතා කරන සාමාන්‍ය හෙරොයින් පැකට් ගණන 03 කි. යම් පුද්ගලයෙක් එක් වරකදී භාවිතා කරනු ලබන හෙරොයින් පැකට් එකක අන්තර්ගත හෙරොයින් ප්‍රමාණය දළ වශයෙන් 20mg කි. වීදි මට්ටමේ අලෙවි කරනු ලබන හෙරොයින් පැකට් එකක මිලෙහි සාමාන්‍ය රුː 1025.00 කි. ගංජා පිළිබඳ අවධානය යොමු කිරීමේදී එක්වරකට භාවිත කිරීම සඳහා ලබා ගන්නා ගංජා කොටසක මිල රු. 200 - 300 අතර අගයක විය. දිනපතා ගංජා භාවිතා කරන පුද්ගලයෙක් සිය මත්ද්‍රව්‍ය භාවිතය සඳහා දිනකට වැය කරනු ලබන සාමාන්‍ය මුදල් ප්‍රමාණය රුපියල් 550 ක්වේ.

හෙරොයින් නොමැති අවස්ථාවල භාවිතා කරන විකල්ප ද්‍රව්‍ය අතරින් Morphine පෙති බහුතරයක් විසින් භාවිතා කරනු ලැබ ඇත. ඊට අමතරව Pseudoephedrine, Tramodol සහ Diazapam වැනි පෙතිවර්ග ද භාවිත කරනු ලබයි. මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදි සඳහා ස්ත්‍රී හා පුරුෂ වශයෙන් යොමු වීමේ පවත්නා කාලීන තත්ත්වය පිළිබඳ සැළකීමේදී තහවුරු වූ ප්‍රධාන කරුණක් නම් මත්ද්‍රව්‍ය භාවිතා කිරීම සම්බන්ධයෙන් පුරුෂයින්ට සාපේක්ෂව කාන්තාවන් ඉතා සුළු ප්‍රතිශතයක් වාර්තා වී ඇති බවයි. නමුත් මත්ද්‍රව්‍ය අලෙවිය සහ ජාවාරම් කිරීම සම්බන්ධයෙන් සැළකීමේදී කාන්තාවන්ගේ යොමු වීමේ ප්‍රවණතාවක් හඳුනා ගත හැකිවිය.

# හැඳින්වීම

මතින් නිදහස් රටක් සඳහා වූ ඉදිරි දැක්ම යාවත්කාලීන කිරීම උදෙසාත්, ගෝලීය වශයෙන් මානව වර්ගයාගේ ප්‍රගමනයට බාධාකාරී වන වාද විෂයයක් වූ මත්ද්‍රව්‍ය දුර්භාවිතය සහ එහි බලපෑම් අවම කිරීම සඳහාත් සමාජ පර්යේෂණ ක්ෂේත්‍රය ඔස්සේ ඉටුකළ හැකි වගකීම පුළුල් පරාසයක් තුළ විහිදී පවතී. එකී සමාජ වගකීම තුළ මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය සහ එහි ප්‍රවණතා හඳුනාගැනීම අත්‍යවශ්‍ය සාධකයක් වෙයි.

මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය සහ එහි ප්‍රවණතා පිළිබඳ සැලකීමේදී අවධාරණය කළයුතු ප්‍රධානම කරුණ නම්, උක්ත ප්‍රපංච දෙකම කාලානුරූපීව විවිධ වෙනස්කම් වලට භාජනය වෙමින් පැවතීමයි. කාලානුරූපීව පැන නගින සමාජ, ආර්ථික සහ දේශපාලන ප්‍රවාහයන්ගේ ඍජු සහ වක්‍ර බලපෑම් වලට නතු වෙමින් එම ප්‍රපංචයන්ගේ ස්වරූපය මෙකී වෙනස්කම් වලට බඳුන් වෙයි. මෙවැනි පසුබිමක් තුළ මත්ද්‍රව්‍ය සඳහා පවත්නා ඉල්ලුම, මත්ද්‍රව්‍ය සැපයුම, මත්ද්‍රව්‍ය වල ශුද්ධතාවය සහ මිල ගණන්, වෙනස් ස්වරූපයන්ගෙන් සහ බලපෑම් වලින් යුතු නව මත්ද්‍රව්‍ය වර්ග ආදී කරුණු පිළිබඳව නව ප්‍රවණතා සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීමේදී අවධානය යොමු කළ යුතුයි.

මෙම අධ්‍යයනය තුළදී මත්ද්‍රව්‍ය භාවිතයේ ප්‍රචලිතභව මිනුම් කිරීමට ලක්කර ඇති අතර මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන්ගේ කාලීන පැතිකඩයන් කෙරෙහිද අවධානය යොමු කර ඇත. විශේෂයෙන් මත්ද්‍රව්‍ය භාවිතය ආශ්‍රිත නව ප්‍රවණතා එනම්, නව මත්ද්‍රව්‍ය ප්‍රභේදයන්, ප්‍රදේශ අනුව මත්ද්‍රව්‍ය ආශ්‍රිත ව්‍යාප්තියේ විෂමතා, කාන්තාවන් හා පාසල් ළමුන්ගේ මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදි සඳහා යොමුවීම වැනි සංරචක පිළිබඳ අධ්‍යයනය කර ඇත.

දිවයිනේ තෝරාගත් පොලිස් බල ප්‍රදේශ 28ක් ඇසුරින් මෙම අධ්‍යයනය සිදුකර ඇති අතර දත්ත රැස් කිරීමේදී එකම කාල පරාසයක් තුළ අධ්‍යයන ක්ෂේත්‍රය ආවරණය කරමින් එක් එක් ප්‍රදේශ වලට අදාළව මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය සහ නූතන ප්‍රවණතා ආශ්‍රිතව රැස්කර ගත් දත්ත මත පදනම්ව මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය මිනුම් කර ඇති අතර නව ප්‍රවණතා ද හඳුනා ගෙන ඇත.

**පර්යේෂණ පසුබිම**

මත්ද්‍රව්‍ය දුර්භාවිතය වසංගතමය අධ්‍යයන (Epidemiology) අතර සාකච්ඡාවට බඳුන් වන ප්‍රධාන නිර්ණායකයක් බවට පත්ව ඇත. විශේෂයෙන්ම HIV/AIDS, හෙපටයිටිස් සී (HCV), හෙපටයිටිස් බී (HBV) වැනි රෝගී තත්ත්වයන් මත්ද්‍රව්‍ය භාවිතා කරන ජනගහනය අතර බහුල වශයෙන් ව්‍යාප්ත වෙමින් පවතී. (Off Print From Bulletin on Narcotics, Vol. LIV. Nos 1 and 2, 2002) වසංගතමය තත්ත්වයක් දක්වා වර්ධනය වූ මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි මත්ද්‍රව්‍ය ආශ්‍රිත නූතන ප්‍රවණතා සහ ඒ ආශ්‍රිත රටාඍජුවම බලපෑම් කරනු ලබයි. මත්ද්‍රව්‍ය භාවිතයට පළමුවෙන් යොමුවන්නන් තුළ පෙළඹවීමක් ඇති කිරීමට සහ අත්හදා බැලීම සඳහා උනන්දුවක් ඇති වීමටද මත්ද්‍රව්‍ය ආශ්‍රිත නව ප්‍රවණතා සහ රටාබලපෑම් කරයි. එවැනි පසුබිමක් තුළ මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය අවම කිරීමට

සහ එහි අවදානම් සහගත බලපෑම් අවම කිරීම සඳහා උද්ගත වෙමින් පවතින මත්ද්‍රව්‍ය ආශ්‍රිත නව ප්‍රවණතා හඳුනා ගැනීම අත්‍යවශ්‍ය කරුණක් බවට පත් වී ඇත. නීතිය ක්‍රියාත්මක කිරීම තුළින් පමණක් නව ප්‍රවණතා මර්දනය කළ නොහැකි අතරම නීතියේ පවත්නා යම් හිඩැස් තුළින් සහ නීතිය ක්‍රියාත්මක වීම තුළ පවත්නා යම් පසුගාමී තත්ත්වයන් තුළ මත්ද්‍රව්‍ය ආශ්‍රිත මෙම නව ප්‍රවණතා තවදුරටත් වර්ධනය වීම සිදු වෙයි. නිදසුනක් ලෙස, යම් වෛද්‍යමය අරමුණු සඳහා භාවිතා කරන ඖෂධයක් තහනම් කිරීම තුළ ඒ වෙනුවට වෙනත් විකල්ප ඖෂධයක් අවභාවිතා කිරීමට යොමුවීමේ ප්‍රවණතාවක් මතුවිය හැකිය.

UNODC ඇස්තමේන්තුගත දත්ත වාර්තා වලට අනුව මිලියන 155ත් 250ත් අතර (වයස අවුරුදු 15-64ත් අතර) ජනගහනයක් පසුගිය වර්ෂය තුළ නීත්‍යානුකූල නොවන ඖෂධ භාවිතා කර ඇත. 2015 ලෝක මත්ද්‍රව්‍ය වාර්තාවට අනුව පුද්ගලයින් 6 දෙනෙකුගෙන් එක් අයෙක් මත්ද්‍රව්‍ය අක්‍රමතාවයන්ගෙන් (SUD) පෙළෙන අතර මත්ද්‍රව්‍ය පරායත්තතාව සඳහා ප්‍රතිකාර ද ලබා ගනියි. මෙම ප්‍රතිශත අගයයන් ලෝකයේ එක් එක් කලාපවලට සාපේක්ෂව ගණනය කිරීමේදී කලාපීය වශයෙන් වෙනසක් ඇත.

මත්ද්‍රව්‍ය භාවිතා කරන ජනගහනය අතර එන්නත් කිරීම මගින් මත්ද්‍රව්‍ය ලබාගන්නා ජනගහනය වැඩි අවදානම් සහිත සහ ආන්තීකරණය වූ කණ්ඩායමක් බවට පත්ව ඇත. ඔවුන් පුළුල් පරාසයක වූ සෞඛ්‍යමය, සමාජ, ආර්ථික සහ නෛතික වශයෙන් අවදානම් සහගත තත්ත්වයන්ට සහ අභියෝගවලට මුහුණ දෙමින් සිටියි. UNODC, WHO, UNAIDS සහ ලෝක බැංකුව එක්ව 2013 වර්ෂයේදී ලෝකයේ මත්ද්‍රව්‍ය එන්නත් කර ගන්නා ජනගහනය මිලියන 12.19ක් ලෙස ඇස්තමේන්තුගත කර ඇත. මෙය වයස අවුරුදු 15-64ත් අතර වැඩිහිටි ජනගහනයෙන් 0.26%ක ප්‍රතිශතයකි. ගෝලීය මත්ද්‍රව්‍ය එන්නත් කර ගන්නා ජනගහනයෙන් 13.5%ක් HIV වෛරසය ආසාදිත වූවන්ය.

එන්නත් කිරීම මගින් මත්ද්‍රව්‍ය එන්නත් කර ගන්නා පුද්ගලයින් අතර කැපී පෙනෙන ලෙස වර්ධනය වන රෝගී තත්ත්වයක් ලෙස හෙපටයිටිස් සී තත්ත්වය සැළකිය හැකිය. ලෝක ජනගහනයෙන් 2.2%ක ප්‍රතිශතයක් හෙපටයිටිස් සී ආසාදිතයින් වන අතර එය මත්ද්‍රව්‍ය එන්නත් කර ගන්නා ලෝක ජනගහනය අතරින් 52%ක අගයයක් ගනියි. (ලෝක මත්ද්‍රව්‍ය වාර්තාව, 2015)

මත්ද්‍රව්‍ය අධිමාත්‍රික වීමද මත්ද්‍රව්‍ය භාවිතය ආශ්‍රිතව පැන නගින වඩාත් දරුණුම සහ සැළකිය යුතු අවදානම් තත්ත්වයයි. UNODC දත්ත වාර්තා අනුව 2013 වර්ෂය තුළ 187,100ක් මත්ද්‍රව්‍ය ආශ්‍රිත මරණ වාර්තා වී ඇත.

මත්ද්‍රව්‍ය භාවිතය ආශ්‍රිත ප්‍රවණතා පිළිබඳ සැළකීමේදී ස්ත්‍රී පුරුෂ වශයෙන් පවත්නා අසමානතා සහ ඒ ආශ්‍රිතව ලැබෙන දත්තවල අසමබරතාවයන් වඩාත් කැපී පෙනෙන ලක්ෂණයකි. ගෝලීය වශයෙන් සැළකීමේදී සමස්තයක් ලෙස ස්ත්‍රීන්ට සාපේක්ෂව පුරුෂ ජනගහනය අතර මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වීමේ ඉහළ ප්‍රවණතාවක් පෙන්නුම් කරයි.

කාන්තාවන් මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවීම ආශ්‍රිත සාහිත්‍ය විමර්ශනය කිරීමේදී පැහැදිලි වන කරුණක් නම්, කාන්තාවන් මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වීම කෙරෙහි බලපානු ලබන ප්‍රබලම සහ ආසන්නතම සාධකය බවට පත්ව ඇත්තේ සිය සහකරුවා හෝ සමීපතමයන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයයි. ලෝක මත්ද්‍රව්‍ය වාර්තාව 2015 තුළද ඒ බව උපුටා දක්වා ඇත. එම වාර්තාවට අනුව මත්ද්‍රව්‍ය භාවිතා කරන ස්ත්‍රීන් අතර බහුතරයක් වැඩි යොමුවීමක් පෙන්නුම් කරනුයේ, වට්ටෝරුගත ඖෂධ සහ Tranquillizers භාවිතා කිරීම සඳහායි.

ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදි සඳහා බන්ධනාගාරගත වීම් පිළිබඳ දත්ත සැළකිල්ලට ගැනීමේදී 2015 වර්ෂය තුළ මත්ද්‍රව්‍ය වැරදි සඳහා කාන්තාවන් 178 දෙනෙක්ද, සුරාබදු වැරදි සඳහා කාන්තාවන් 69 දෙනෙක්ද බන්ධනාගාරගත කර ඇත. එය පුරුෂයින්ගේ බන්ධනාගාරගත වීමේ ප්‍රතිශතය සමඟ සැසඳීමේදී පහළ අගයයක් බව පැහැදිලි වේ. මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදි සම්බන්ධයෙන් වෙන් වෙන් වශයෙන් සළකා බැලීමේදී පැහැදිලි වන කරුණක් නම්, මත්ද්‍රව්‍ය හා මත්පැන් භාවිතා කිරීමට වඩා ඒවා අලෙවි කිරීම හා බෙදා හැරීම සම්බන්ධයෙන් කාන්තාවන් අතර වැඩි ප්‍රවණතාවක් පවතින බවයි.

ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය ආශ්‍රිත අත්අඩංගුවට ගැනීම් වල ව්‍යාප්තිය පිළිබඳ විමර්ශනය කිරීමේදී පැහැදිලි වන කරුණක් නම්, නාගරික සහ උපනාගරික ප්‍රදේශ ආශ්‍රිතව අත්අඩංගුවට ගැනීම් වල ඉහළ ව්‍යාප්තියක් පෙන්නුම් කරන අතර කොළඹ සහ වෙරළාසන්න ප්‍රදේශවලට සාපේක්ෂව අභ්‍යන්තර සහ පූර්ණ වශයෙන් නාගරීකරණය නොවූ ප්‍රදේශ වල අත්අඩංගුවට ගැනීම් වල අඩු ප්‍රවණතාවක් පෙන්නුම් කරයි.

**වගු අංක 01 ඃ- 2015 දිස්ත්‍රික්ක අනුව මත්ද්‍රව්‍ය ආශ්‍රිත අත්අඩංගුවට ගැනීම් වල ව්‍යාප්තිය**

| දිස්ත්‍රික්කය | මත්ද්‍රව්‍ය වර්ගය | |
|---|---|---|
| | ගංජා | හෙරොයින් |
| **කොළඹ** | 18,501 | 16,846 |
| **ගම්පහ** | 5,945 | 4,671 |
| **මහනුවර** | 1,841 | 500 |
| **කුරුණෑගල** | 2,267 | 704 |
| **පුත්තලම** | 1,469 | 304 |
| **රත්නපුර** | 2,145 | 478 |

**මූලාශ්‍රය ඃ- මත්ද්‍රව්‍ය දුර්භාවිතය තොරතුරු අත්පොත - 2015**

භූගෝලීය විෂමතාවයන් සහ සමාජ, ආර්ථික සාධකයන්ගේ විෂමතාවයන්ගේ බලපෑම මත එක් එක් කලාප තුළ මත්ද්‍රව්‍ය ව්‍යාප්තියේ ඉහළ හා පහළ වශයෙන් විෂම ව්‍යාප්තියක් පෙන්නුම් කරයි. අත්අඩංගුවට ගැනීම් වලට අදාළ දත්ත තුළින් මෙන්ම ප්‍රතිකාර වලට යොමුවීමට අදාළ දත්ත වලින්ද

එය පැහැදිලි වෙයි. 2015 වර්ෂයට අදාළ මත්ද්‍රව්‍ය භාවිත අක්‍රමතා සඳහා ප්‍රතිකාර වලට යොමුවීමට අදාළ දත්ත වලට අනුව ප්‍රතිකාර සඳහා ඇතුළත් වූ පුද්ගලයින්ගෙන් 56%ක් කොළඹ දිස්ත්‍රික්කයේ පදිංචි පුද්ගලයින්ය. ගම්පහ දිස්ත්‍රික්කයෙන් 18%ක් ද, මහනුවර දිස්ත්‍රික්කයෙන් 2%ක් සහ කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් 2%ක් වශයෙන් ප්‍රතිකාර සඳහා ඇතුළත් වූ පුද්ගලයින්ගේ ව්‍යාප්තිය වාර්තා වී ඇත.

මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය කෙරෙහි සමාජ සහ පාරිසරික සාධක ඍජුවම බලපෑම් කරනු ලබයි. අධික ජන ඝනත්වය සහ නිවාස ඝනත්වය, නාගරීකරණය වූ පාරිසරික තත්ත්වයන් මෙන්ම සම්පත් ඌණතාවයන් වැනි සාධක වල බලපෑමෙන් මත්ද්‍රව්‍ය ව්‍යාප්තිය ඉහළ යාමක් සිදුවෙයි.

මත්ද්‍රව්‍ය භාවිතය සඳහා ඇබ්බැහිවූවන් එම මත්ද්‍රව්‍ය ශරීරගත කර ගැනීමට අනුගමනය කරනු ලබන මාර්ගයද විවිධ ස්වරූප ගනියි. එන්නත් කිරීම, කෑමක් බීමක් ලෙස හෝ දුමක් ලෙස භාවිතා කිරීම බහුල වශයෙන් සිදුවේ. මත්ද්‍රව්‍ය ශරීරගත කර ගන්නා මාර්ග තීරණය වීම කෙරෙහි භාවිතා කරන මත්ද්‍රව්‍ය එහි ගුණාත්මකභාවය හෝ ශුද්ධතාවය සහ මිල ගණන් බලපානු ලබයි. (Bulletin on Narcotics, Vol. LIV, Nos. 1 and 2, 2002)

මත්ද්‍රව්‍ය ආශ්‍රිත නව ප්‍රවණතා පිළිබඳ අධ්‍යයනය කිරීමේදී බහුල ලෙස ව්‍යාප්ත වී ඇති මත්ද්‍රව්‍ය වර්ග, භාවිතා කරන රටා, මත්ද්‍රව්‍ය වල ශුද්ධතාවය, මිල ගණන්, භාවිතා කරන පුද්ගලයින් මුහුණපාන සමාජ, ආර්ථික හා සෞඛ්‍යමය අභියෝග, ඇබ්බැහි වන පුද්ගලයින්ගේ සමාජ, ආර්ථික පසුබිම් පිළිබඳව අධ්‍යයනය කළ යුතුය.

**පර්යේෂණ ගැටලුව**

මත්ද්‍රව්‍ය දුර්භාවිතය කාලානුරූපීව විවිධ සමාජ, ආර්ථික හා දේශපාලන සංසිද්ධීන්ගේ බලපෑමට ලක්වෙමින් වෙනස් වන ප්‍රපංචයකි. මෙවැනි පසුබිමක් තුළ සිට මත්ද්‍රව්‍ය දුර්භාවිතය පාලනය හා නිවාරණය කිරීම උදෙසා සක්‍රීයව මැදිහත් වීමේදී එසේ ඇතිවන වෙනස්කම් සහ නව ප්‍රවණතා හඳුනා ගෙන තිබීම මනා පිටිවහලක් වෙයි. මෙම අධ්‍යයනය තුළ ප්‍රධාන පර්යේෂණ ගැටලුව බවට පත්වූයේ, මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තියෙහි වර්ධනයක් හෝ පාලනයක් සිදුවී ඇත්ද? යන්න සහ මත්ද්‍රව්‍ය භාවිතය ආශ්‍රිතව මතුව ඇති නව ප්‍රවණතා මොනවාද? යන්නයි.මෙම අධ්‍යයනය දිශාගතව ඇත්තේ උක්ත පර්යේෂණ ගැටලු අධ්‍යයනය කිරීමෙන් ලද නිගමන සහ නිර්දේශ ඉදිරිපත් කිරීම උදෙසාය.

**පර්යේෂණ අරමුණු**

1. මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය ඉහළ සහ පහළ ප්‍රදේශ හඳුනා ගැනීම.

ලංකාවේ මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය පිළිබඳ සැළකීමේදී අත්අඩංගුවට ගැනීම් ආශ්‍රිත දත්ත වලට අනුව විෂම ව්‍යාප්තියක් හඳුනාගත හැකිය. එම ව්‍යාප්තිය මත්ද්‍රව්‍ය වර්ගය සහ අත්අඩංගුවට ගැනීම් වල සංඛ්‍යාත්මක අගයයන් මෙන්ම ප්‍රමාණ අනුවද වෙනස් වේ. ඊට අමතරව කාන්තාවන් මත්ද්‍රව්‍ය දුර්භාවිතය තුළ නියෝජනය වන ප්‍රවණතාව, තරුණ ජනගහනයේ යොමුවීම, නව මත්ද්‍රව්‍ය

ප්‍රභේදයන්ගේ ආගමනය හා ඒවා නීතියේ රැහැනට හසුවීමේ අවස්ථාවන් මතද මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය හඳුනා ගත හැකිය. එම කරුණ කෙරෙහි මෙම අධ්‍යයනය තුළ අවධානය යොමු කර ඇත.

2. මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන්ගේ කාලීන පැතිකඩ අධ්‍යයනය කිරීම.

භාවිතයට යොමුවන වයස, සමාජ හා ප්‍රජා විද්‍යාත්මක කරුණු, සෞඛ්‍යමය ගැටලු, නීතිමය තත්ත්වයන්ට මුහුණ දීම සහ ප්‍රතිකාර ක්‍රියාවලියට යොමුවීම් වැනි කරුණු කෙරෙහි මෙහිදී අවධානය යොමු කර ඇත. මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන්ගේ කාලීන සමාජ, ආර්ථික පැතිකඩ (Social Demographic Profile) සහ මත්ද්‍රව්‍ය භාවිත රටා(Drug Use Pattern) කාලානුරූපීව වෙනස් වීමට ලක්වෙයි.

3. මත්ද්‍රව්‍ය භාවිතය ආශ්‍රිත නව ප්‍රවණතා හඳුනා ගැනීම.

විවිධ කායික සහ මානසික බලපෑම් වලින් යුතු නව මත්ද්‍රව්‍ය ප්‍රභේදයන්, නව තාක්ෂණික ක්‍රම ශිල්ප භාවිතා කරමින් කරනු ලබන මත්ද්‍රව්‍ය බෙදාහැරීම්, එක් එක් මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වී සිටින පුද්ගලයින්ගේ ස්වභාවයන්, මත්ද්‍රව්‍ය භාවිතය තුළ මුහුණ දෙන සෞඛ්‍යමය අභියෝගයන් සහ සමාජ, ආර්ථික පසුබිම් ආදිය ගැන මේ යටතේ අධ්‍යයනයට ඇතුළත් කර ඇත.

**පර්යේෂණ ක්‍රමවේදය**

මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය සහ නූතන ප්‍රවණතා පිළිබඳව අධ්‍යයනය කිරීමේදී ඉහත පර්යේෂණ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රමාණාත්මක දත්ත මෙන්ම ගුණාත්මක දත්ත උපයෝගී කර ගෙන ඇත. ප්‍රමාණාත්මක වශයෙන් මිනුම් කළ හැකි ප්‍රපංච සහ විචල්‍යයන් අධ්‍යයනය කිරීම සඳහා ප්‍රමාණාත්මක ලෙස දත්ත රැස් කිරීම සිදු කර ඇති අතර මතුපිටට දෘශ්‍ය නොවන ගැඹුරු ප්‍රපංච පිළිබඳව අධ්‍යයනය කිරීමේදී ගුණාත්මක දත්ත භාවිතා කර ඇත. ඒ අනුව මෙම අධ්‍යයනයේ පර්යේෂණ ක්‍රමවේදය ලෙස ප්‍රමාණාත්මක හා ගුණාත්මක ශිල්ප ක්‍රම අන්තර්ගත මිශ්‍ර පර්යේෂණ ක්‍රමවේදයක් භාවිතා කර ඇත.

**පර්යේෂණ ක්‍රමය සහ දත්ත රැස් කිරීමේ ශිල්ප ක්‍රම**

උක්ත පර්යේෂණ ක්‍රමවේදය යටතේ සමීක්ෂණ ක්‍රමය (Servey Method) පර්යේෂණ ක්‍රමය වශයෙන් යොදා ගනිමින් දත්ත රැස් කිරීම සිදු කර ඇත. එහිදී මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන්ගේ ප්‍රජා සමාජ විද්‍යාත්මක පැතිකඩ, මත්ද්‍රව්‍ය භාවිත රටාපිළිබඳ දත්ත සහ මත්ද්‍රව්‍ය ව්‍යාප්තිය පිළිබඳ දත්ත ලබා ගැනීම සඳහා ව්‍යුහගත ප්‍රශ්නාවලියක් භාවිතා කරන ලදි. ඊට අමතරව මත්ද්‍රව්‍ය ව්‍යාප්තිය ආශ්‍රිත නව ප්‍රවණතා, මත්ද්‍රව්‍ය භාවිත රටාකෙරෙහි බලපාන සමාජයීය හා පාරිසරික සාධක සහ ප්‍රදේශ අනුව ව්‍යාප්තියේ විෂමතාවයන් කෙරෙහි බලපාන සාධක පිළිබඳව ගැඹුරින් අධ්‍යයනය කිරීම සඳහා සම්මුඛ සාකච්ඡා ශිල්ප ක්‍රමය භාවිතා කරන ලදි. එහිදී එක් එක් අධ්‍යයන ක්ෂේත්‍රවල පොලිස් ස්ථාන වල පොලිස් නිලධාරීන්, ග්‍රාම නිලධාරීන් ඇතුළු ප්‍රජාව සමඟ බිම් මට්ටමේ සිට සේවයේ නියුතු රාජ්‍ය නිලධාරීන් මූලික තොරතුරු සපයන්නන් ලෙස යොදා ගනිමින් ඔවුන් සමඟ ද සම්මුඛ සාකච්ඡා මගින් තොරතුරු ලබා ගන්නා ලදි. මණ්ඩලයේ පර්යේෂණ නිලධාරීන්ගේ ඍජු අධීක්ෂණය

යටතේ කලින් පුහුණු කරන ලද පර්යේෂණ කණ්ඩායමක් විසින් දත්ත එක්රැස් කිරීම සිදු කර ඇත. ඉහත ශිල්ප ක්‍රමයන් තුළින් ලබා ගත් ප්‍රාථමික දත්ත වලට අමතරව ද්විතියික මූලාශ්‍ර ඔස්සේ ලබා ගත් අධ්‍යයනයට ලක් කළ සංකල්පවලට අදාළ ද්විතියික දත්තද විශ්ලේෂණය තුළ භාවිතා කර ඇත.

**පර්යේෂණ ක්ෂේත්‍රය සහ නියැදිය තෝරා ගැනීම**

මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය සහ නූතන ප්‍රවණතා පිළිබඳව අධ්‍යයනය කිරීමට සහ ඒවායේ වෙනස් ස්වරූපයන් සංසන්දනාත්මකව හඳුනා ගැනීම සඳහා එකම අධ්‍යයන කාල පරාසයක් තුළ තෝරාගත් විවිධ ප්‍රදේශ (Spots) ආශ්‍රයෙන් දත්ත රැස් කිරීම සිදු කර ඇත.

2015 වර්ෂය තුළ මත්ද්‍රව්‍ය ආශ්‍රිත අත්අඩංගුවට ගැනීම්, බන්ධනාගාරගත වීම් සහ ප්‍රතිකාර සඳහා යොමුවීමට අදාළ දත්ත සැළකිල්ලට ගනිමින් දිවයිනේ ඉහළ ව්‍යාප්තියක් සහිත පළාත්, එම පළාත් වල ඉහළ ව්‍යාප්තියක් සහිත දිස්ත්‍රික්කයන් සහ එම දිස්ත්‍රික්කයන් තුළ ඉහළ ව්‍යාප්තියක් සහිත පොලිස් බල ප්‍රදේශ 28ක් මෙම අධ්‍යයනයේ ක්ෂේත්‍රය වශයෙන් යොදා ගෙන ඇත.

**වගු අංක 02 ඃ- අධ්‍යයන ක්ෂේත්‍රය තෝරාගත් ආකාරය**


| අනු අංකය | පළාත | තෝරාගත් දිස්ත්‍රික්කය | තෝරාගත් පොලිස් කොට්ඨාශය |
|---|---|---|---|
| 1. | බස්නාහිර පළාත | කොළඹ | කොළඹ - උතුර<br>කොළඹ - දකුණ<br>කොළඹ - මධ්‍යම<br>නුගේගොඩ/ගල්කිස්ස |
| | | ගම්පහ | කැලණිය<br>මීගමුව<br>ගම්පහ |
| | | කළුතර | පානදුර<br>කළුතර |
| 2. | දකුණු පළාත | ගාල්ල | ගාල්ල / ඇල්පිටිය |
| | | මාතර | මාතර |
| | | හම්බන්තොට | තංගල්ල<br>හම්බන්තොට |
| 3. | මධ්‍යම පළාත | මහනුවර | මහනුවර |
| | | මාතලේ | මාතලේ |
| 4. | වයඹ පළාත | කුරුණෑගල | කුරුණෑගල<br>කුලියාපිටිය |
| | | පුත්තලම | පුත්තලම |
| 5. | උතුරු මැද පළාත | අනුරාධපුර | අනුරාධපුර |

| | | | |
|---|---|---|---|
| | | පොළොන්නරුව | පොළොන්නරුව |
| 6. | සබරගමු පළාත | රත්නපුර | රත්නපුර |
| | | කෑගල්ල | කෑගල්ල |
| 7. | ඌව පළාත | බදුල්ල | බදුල්ල |
| 8. | නැගෙනහිර පළාත | ත්‍රිකුණාමලය | ත්‍රිකුණාමලය |
| 9. | උතුරු පළාත | මන්නාරම | මන්නාරම |
| | | වව්නියාව | වව්නියාව |

ඉහත සටහනට අනුව දිවයිනේ පළාත් 09 තුළ හෙරොයින් සම්බන්ධ අත්අඩංගුවට ගැනීම් වල ව්‍යාප්තිය අනුව තෝරාගත් ඉහළ ව්‍යාප්තියක් සහිත දිස්ත්‍රික්ක 18ක් සහ එම දිස්ත්‍රික්ක වල ඉහළ ව්‍යාප්තියක් සහිත පොලිස් බල ප්‍රදේශ 28ක් අධ්‍යයන ප්‍රදේශ (Spots) වශයෙන් යොදා ගෙන ඇත.

ඉහත අධ්‍යයන ක්ෂේත්‍ර තුළින් හෙරොයින්, ගංජා ඇතුළු අන්තරායකර ඖෂධ දැනට භාවිතා කරන පුද්ගලයින් හිමබෝල නියැදි ක්‍රමය (Snow Ball Sampling Technique) භාවිතා කරමින් අධ්‍යයනයේ නියැදියට ඇතුළත් කර ගන්නා ලදී. මෙහිදී ප්‍රාථමික නියැදුම් ඒකකය පොලිස් බල ප්‍රදේශ වන අතර පොලිස් බල ප්‍රදේශ මට්ටමින් පුද්ගලයින් නියැදියට ඇතුළත් කර ගනිමින් දත්ත රැස් කිරීම සිදු කර ඇත. ඒ අනුව හිමබෝල නියැදි ක්‍රමය උපයෝගී කර ගනිමින් සසම්භාවී නොවන ලෙස දත්ත දායකයින් 1,079ක් අධ්‍යයනය සඳහා යොදා ගෙන ඇත. පළාත් අනුව දත්ත දායකයින්ගේ ව්‍යාප්තිය පහත සිතියමෙහි දක්වා ඇත.

**සිතියම් අංක 01 ඃ-පළාත් මට්ටමින් දත්ත දායකයන්ගේ ව්‍යාප්තිය**




## නියැදිය තුළ මත්ද්‍රව්‍ය භාවිතයෙහි සංයුතිය හා උපනතීන්

අධ්‍යයනයේ නියැදිය තුළ නියෝජනය වූ දත්ත දායකයින්ගේ මත්ද්‍රව්‍ය භාවිත රටා අධ්‍යයනය කිරීමේදී බහුතරයක් එක් මත්ද්‍රව්‍යයක් හෝ කිහිපයක් භාවිතා කරනු ලබන පුද්ගලයින්ය. නීත්‍යානුකූල මත්ද්‍රව්‍ය හා මත්පැන් මෙන්ම නීත්‍යානුකූල නොවන මත්ද්‍රව්‍ය හා මත්පැන් යන විවිධ කාණ්ඩවලට අයත් ද්‍රව්‍යය භාවිතා කරන පුද්ගලයින් නියැදිය තුළ නියෝජනය විය. මෙහිදී අදාළ දත්ත දායකයින් දැනට භාවිතා කරන මත්ද්‍රව්‍ය හා මත්පැන් වර්ග මෙන්ම පූර්වයෙන් භාවිතා කර ඇති මත්ද්‍රව්‍ය හා මත්පැන් වර්ග සම්බන්ධයෙන්ද අධ්‍යයනය කරන ලද අතර ඔවුන්ගේ වර්තමාන මත්ද්‍රව්‍ය භාවිතය හා සම්බන්ධ දත්ත මත පදනම්ව මත්ද්‍රව්‍ය භාවිත රටා සහ නූතන ප්‍රවණතාවලට අදාළ දත්ත ලබා ගෙන ඇත. නියැදිය තුළ නියෝජනය වූ පුද්ගලයින් අතුරින් එක් එක් මත්ද්‍රව්‍ය හා මත්පැන් වර්ග භාවිතා කරන පුද්ගල සංයුතිය පහත සංඛ්‍යාත්මක වගුව තුළ නිරූපණය කර ඇත.

**වගු අංක 03 ඃ- නියැදිය තුළ මත්ද්‍රව්‍ය භාවිතයෙහි සංයුතිය**

| **මත්ද්‍රව්‍ය වර්ගය** | **භාවිතා කරන පුද්ගලයින් සංඛ්‍යාව** |
| --- | --- |
| සිගරැට් | 930 (86%) |
| නීත්‍යානුකූල මත්පැන් | 617 (57%) |
| නීත්‍යානුකූල නොවන මත්පැන් | 115 (11%) |
| බියර් | 378 (35%) |
| රා | 44 (4%) |
| ගංජා | 711 (66%) |
| හෙරොයින් | 455 (42%) |
| අබිං/ හෂිස් | 10 (0.9%) |
| පෙති වර්ග | 72 (7%) |

**මූලාශ්‍රය ඃ- (සමීක්ෂණ දත්ත, 2016)**

ඉහත දත්ත විමර්ශනය කිරීමේදී පැහැදිලි වන ප්‍රධානම කරුණ නම්, අධ්‍යයනයේ නියැදිය තුළ නියෝජනය වූ සියලු දත්ත දායකයින් බහුවිධ මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන් (Multiple drug users) බවයි. එනම්, එක් පුද්ගලයෙකුගේ මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ රටා අධ්‍යයනය කිරීමේදී ඔහු හෝ ඇය මත්ද්‍රව්‍ය හෝ මත්පැන් වර්ග කිහිපයක් භාවිතා කරනු ලබයි. ඒ අනුව සිගරැට් භාවිතය සම්බන්ධයෙන් නියැදිය තුළ ඉහළ ප්‍රවණතාවක් පෙන්නුම් කරන අතර අබිං සහ හෂිස් සම්බන්ධයෙන් නියැදිය තුළ අඩු ප්‍රවණතාවක් පෙන්නුම් කරයි.

තවදුරටත් උක්ත සංඛ්‍යා දත්ත තුළින් ගම්‍ය වන කරුණක් නම්, නීත්‍යානුකූල මත්ද්‍රව්‍ය හා මත්පැන් අතර සිගරැට් සහ අරක්කු සඳහා නියැදිය තුළ ඉහළ යොමුවීමක් පෙන්නුම් කරන අතර නීත්‍යානුකූල නොවන මත්ද්‍රව්‍ය අතර ගංජා සහ හෙරොයින් සඳහා නියැදිය තුළ ඉහළ යොමුවීමක් පෙන්නුම් කරනු ලබයි. සම්මුඛ සාකච්ඡා දත්ත තුළින්ද ඉස්මතු වූ මූලික කරුණක් නම්, හෙරොයින් හෝ ගංජා වැනි අන්තරායකර ඖෂධ ගණයට ගැනෙන මත්ද්‍රව්‍ය වර්ග භාවිතා කරන පුද්ගලයින් ප්‍රාථමික මත්ද්‍රව්‍යයක් ලෙස සිගරැට් භාවිතා කර ඇති බවයි. නියැදිය තුළ සිගරැට් භාවිතා කරන්නන්ගේ සංඛ්‍යාව ඉහළ අගයක් ගැනීම තුළ එය තවදුරටත් තහවුරු වෙයි.


යම් පුද්ගලයෙක් මත්ද්‍රව්‍ය භාවිතය සඳහා ඇබ්බැහි වීම යන සංසිද්ධිය එක් වරම පෙන්නුම් කරනු ලබන චර්යාත්මක වෙනසක් නොව එය අවධීන් කිහිපයක් ඔස්සේ විකාශනය වෙමින් පැමිණ යම් අවස්ථාවක ඇබ්බැහිවීම යන තත්ත්වයට ළඟාවීම සිදු වෙයි. එම විකාශනය පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් වන අතරම ඒ සඳහා ගත වන කාලය ද පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් වෙයි. මෙහිදී අත්හදා බැලීමක් වශයෙන් (Experimental Use) මුලින්ම භාවිතය ආරම්භ කරන අතර එය ක්‍රමිකව ස්ථාවර හෝ විධිමත් භාවිතයක් (Regular Use) බවට පත් වෙයි. එනම් ඔහු හෝ ඇය සිය දෛනික දින චර්යාවේ එක් අංගයක් ලෙස මත්ද්‍රව්‍ය භාවිතා කිරීමට යොමු වෙයි. මෙලෙස ස්ථාවර භාවිතය කාලාන්තරයක් තුළ සිදු කරන විට එය යම් අවදානම් සහගත සහ ගැටලු සහගත

තත්ත්වයට පත් වෙයි (risk taking drug use). එනම් මත්ද්‍රව්‍ය භාවිතය තුළ ශාරීරික, මානසික හා සමාජයීය වශයෙන් අභියෝග අත්විඳීමට පටන් ගන්නා අතර පසුව එය මත්ද්‍රව්‍ය පරායත්තතාවක් (drug dependence) දක්වා ගමන් කරයි.

මත්ද්‍රව්‍ය පරායත්තතාව යන අවධිය දක්වා ළඟා වූ පුද්ලයෙකුගේ මුල් භාවිත වයස, එනම් අත්හදා බැලීමක් වශයෙන් එනම් කුතුහලය නිසා මුලින්ම භාවිතා කිරීම ඇතැම් විට නව යොවුන් විය හෝ ඊට පසු කාලය තුළ සිදු විය හැකිය. මෙම අධ්‍යයනය තුළ නියෝජනය වූ පුද්ගලයින්ගේ මත්ද්‍රව්‍ය භාවිතයට මුලින්ම යොමු වූ වයස පිළිබඳව සැළකීමේදී බහුතරයක් පුද්ගලයින් වයස අවුරුදු 15ත් 19ත් අතර වයස් මට්ටමකදී ප්‍රථම වරට යම් මත්ද්‍රව්‍යයක් භාවිතා කිරීම සිදු කර ඇත. නියැදිය තුළ නියෝජනය වූ පුද්ගලයින්ගෙන් 607 (61%) ක් වයස අවුරුදු 15ත් 19ත් අතර වයසකදී ද, 187 (19%) දෙනෙක් වයස අවුරුදු 20ත් 24ත් අතර වයසකදී ද සහ පුද්ගලයින් 128 (13%) දෙනෙක් වයස අවුරුදු 14 හෝ ඊට වඩා අඩු වයස් මට්ටමකදී මුල් වරට යම් මත්ද්‍රව්‍යයක් භාවිතා කර ඇත. මෙහිදී වඩාත් සැළකිය යුතු සහ අවදානම් සහගත ප්‍රවණතාවක් නම්, නියැදිය තුළ නියෝජනය වූ පුද්ගලයින්ගෙන් 735 දෙනෙක් වයස අවුරුදු 19ට වඩා අඩු වයස් මට්ටමකදී මුල් වරට මත්ද්‍රව්‍ය භාවිතා කිරීමට යොමු වීම සහ ඒ අතුරින් පුද්ගලයින් 128 දෙනෙක් වයස අවුරුදු 14 හෝ ඊට වඩා අඩු වයස් මට්ටමකදී මත්ද්‍රව්‍ය අත්හදා බැලීමට අවතීර්ණ වී තිබීමයි.

නියැදිය තුළ නියෝජනය වූ දත්ත දායකයින්ගෙන් මුල් වරට මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවීමේ සාමාන්‍ය වයස අවුරුදු 17කි. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය විසින් 2014/2015 වර්ෂයන් වල ක්‍රියාත්මක කරන ලද මත්ද්‍රව්‍ය එන්නත් කරගන්නන් පිළිබඳ දීප ව්‍යාප්ත සමීක්ෂණයෙන් ලද දත්ත වලට අනුව එන්නත් කර ගැනීම මඟින් මත්ද්‍රව්‍ය ශරීරගත කරගන්නා පුද්ගලයින් මුල් වරට මත්ද්‍රව්‍ය භාවිතය සඳහා යොමු වූ සාමාන්‍ය වයස අවුරුදු 16කි. (මත්ද්‍රව්‍ය එන්නත් කරගන්නන් පිළිබඳ දීප ව්‍යාප්ත සමීක්ෂණය 2014/2015)

**ප්‍රස්තාර අංක 1- මුල් වරට මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවීමේ සාමාන්‍ය වයස**





(මූලාශ්‍රය - පර්යේෂණ දත්ත 2016)

පුද්ගලයින් මුල් වරට යම් මත්ද්‍රව්‍යයකට යොමු වන වයස් සීමාව කාලානුරූපීව මෙන්ම එක් එක් කලාපයන් අනුවද විවිධ වෙනස්කම් විය හැකිය. ලෝකයේ විවිධ භූගෝලීය කලාපයන් ඇසුරින් කරන ලද අධ්‍යයනයන්ගේ ප්‍රකාශිත දත්ත වලට අනුව මුල් වරට මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වීමේ වයස් සීමාව වයස අවුරුදු 17ක් හෝ ඊට වඩා අඩු වයස් මට්ටමක පවතී. SAMHSA ආයතනය විසින් 2014 වර්ෂයේ ප්‍රකාශයට පත් කරන ලද TEDS වාර්තාවට අනුව වයස අවුරුදු 18ත් 30ත් අතර මත්ද්‍රව්‍ය පරායත්තතාවය සඳහා ප්‍රතිකාර ක්‍රියාවලියට යොමු වූ පුද්ගලයින්ගේ මුල් වරට යම් මත්ද්‍රව්‍යයක් භාවිතා කරන ලද වයස් සීමාව වයස අවුරුදු 17ක් හෝ ඊට අඩු වයස් මට්ටමක පවතී. (SAMHSA, 2014)

මේ අනුව පැහැදිලි වන්නේ, මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වූ පුද්ගලයින් වයස අවුරුදු 17 හෝ ඊට වඩා අඩු වයස් මට්ටම් වලදී පළමු වරට මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වීම සිදු වී ඇති බවයි.

මෙලෙස මත්ද්‍රව්‍ය භාවිතය සඳහා යොමු වීමට බලපාන ලද හේතුන් පිළිබඳව විමසීමේදී, එය පුළුල් පරාසයක් තුළ විහිද පවතින්නක් බව පැහැදිලි වේ. අධ්‍යයනයට ඇතුළත් දත්ත දායකයින්ගෙන් බහුතරයක් එනම්, 589 දෙනෙක් මිතුරු බලපෑම (Peer Presure) මත සහ 538 දෙනෙක් සතුට හා විනෝදය පිණිස පළමු වරට මත්ද්‍රව්‍ය භාවිතය සඳහා යොමු වී ඇත. එමෙන්ම බොහෝ පුද්ගලයින් සාධක කිහිපයක් හේතුවෙන් මත්ද්‍රව්‍ය භාවිතය සඳහා යොමු වී ඇත. නියැදිය තුළ නියෝජනය වූ පුද්ගලයින්ගෙන් 420 දෙනෙක් මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් පැවති කුතුහලය හේතුවෙන් අත්හදා බැලීමක් වශයෙන් පළමු වරට මත්ද්‍රව්‍ය භාවිතය සඳහා යොමු වී ඇති අතර ගැටලුකාරී අවස්ථාවන්ට මුහුණ දීමේදී පුද්ගලයින් 121 දෙනෙක් මත්ද්‍රව්‍ය භාවිතය සඳහා යොමු වී ඇත.

ප්‍රස්තාර අංක 2 - මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවීමට බලපාන ලද හේතූන්




(මූලාශ්‍රය - පර්යේෂණ දත්ත 2016)

**දත්ත දායකයින්ගේ ප්‍රජා හා සමාජ විද්‍යාත්මක පැතිකඩ**

සසම්භාවී නොවන ලෙස අධ්‍යයනයේ නියැදියට ඇතුළත් කර ගන්නා ලද දත්ත දායකයින්ගේ ප්‍රජා හා සමාජ විද්‍යාත්මක පැතිකඩ සම්බන්ධයෙන් මූලික තොරතුරු අධ්‍යයනය කරන ලද අතර මත්ද්‍රව්‍ය භාවිත රටාසහ ඒ ආශ්‍රිත ප්‍රවණතා පිළිබඳ ප්‍රජා සහ සමාජ විද්‍යාත්මක සාධක මත පදනම්ව දත්ත විශ්ලේෂණ සිදු කර ඇත.

**වගු අංක 04 ඃ- ප්‍රජා හා සමාජ විද්‍යාත්මක සාධක අනුව දත්ත දායකයින්ගේ ව්‍යාප්තිය**

| **විචල්‍යය** | **සංඛ්‍යාතය** |
|---|---|
| **ස්ත්‍රී-පුරුෂ භාවය** | |
| **පුරුෂ** | 1,064 (98.6%) |
| **ස්ත්‍රී** | 15 (1.4%) |
| **වයස** | |
| **අවුරුදු 18ට අඩු** | 24 (2%) |
| **අවුරුදු 19 - 25 අතර** | 198 (18%) |
| **අවුරුදු 26 - 35 අතර** | 430 (40%) |

| | |
|---|---|
| අවුරුදු 36 - 50 අතර | 338 (32%) |
| අවුරුදු 50ට වැඩි | 86 (8%) |
| **ජන වර්ගය** | |
| සිංහල | 823 (76%) |
| ද්‍රවිඩ | 133 (12%) |
| මුස්ලිම් | 106 (10%) |
| බර්ගර් | 5 (0.5%) |
| මැලේ | 2 (0.2%) |
| වෙනත් | 7 (0.6%) |
| **ආගම** | |
| බෞද්ධ | 743 (70%) |
| හින්දු | 97 (9%) |
| ඉස්ලාම් | 108 (10%) |
| ක්‍රිස්තියානි | 74 (7%) |
| රෝමානු කතෝලික | 50 (7%) |
| **අධ්‍යාපන මට්ටම** | |
| මූලික අධ්‍යාපනයක් නොලද (කියවීමට, ලිවීමට නොහැකි) | 46 (4%) |
| ප්‍රාථමික අධ්‍යාපනය (5 ශ්‍රේණිය දක්වා) | 216 (20%) |
| ද්විතියික අධ්‍යාපනය (10 ශ්‍රේණිය දක්වා) | 417 (39%) |
| අ.පො.ස. සා.පෙළ සමත් | 284 (26%) |
| අ.පො.ස. උ.පෙළ සමත් | 101 (10%) |
| ඩිප්ලෝමාධාරී | 6 (0.6%) |
| උපාධි හෝ ඊට ඉහළ | 1 (0.1%) |
| **විවාහක/ අවිවාහක බව** | |
| විවාහක | 526 (49%) |

| | |
|---|---|
| **අවිවාහක** | 487 (45%) |
| **විවාහ නොවී එකට ජීවත්වන** | 13 (1%) |
| **දික්කසාද** | 29 (3%) |
| **විවාහක, වෙන්ව ජීවත්වන** | 16 (2%) |
| **වැන්දඹු** | 1 (0.1%) |
| **මාසික ආදායම (රුපියල්)** | |
| 10,000ට අඩු | 31 (4%) |
| 10,001 - 20,000 | 222 (25%) |
| 20,001 - 50,000 | 540 (61%) |
| 50,001 - 75,000 | 69 (8%) |
| 75,001 - 100,000 | 17 (2%) |
| 100,000ට වැඩි | 6 (0.7%) |

**මූලාශ්‍රය ඃ- (සමීක්ෂණ දත්ත, 2016)**

දත්ත දායකයින්ගේ ප්‍රජා හා සමාජ විද්‍යාත්මක පැතිකඩ ඉහත වගුව තුළ සාරාංශ ගත කර ඇති අතර ඔවුන් භාවිතා කරන මත්ද්‍රව්‍ය වර්ගයන් (type of drugs) සහ ප්‍රජා හා සමාජ විද්‍යාත්මක සාධකවල පවත්නා සහසම්බන්ධතාවය තවදුරටත් මෙම පරිච්ඡේදය තුළ පෙළ ගස්වා ඇත. මත්ද්‍රව්‍ය භාවිතය හා ප්‍රජා විද්‍යාත්මක සාධක අතර යම් යම් අන්තර් සම්බන්ධතාවන් පවතින අතර කාලානුරූපීව එම අන්තර් සබඳතාවන් විවිධ වෙනස්කම් වලට භාජනය වෙයි.

**මත්ද්‍රව්‍ය භාවිතය සහ ප්‍රජා හා සමාජ විද්‍යාත්මක සාධක අතර සම්බන්ධතාවය**


අධ්‍යයනයේ නියැදිය තුළ නියෝජනය වූ පුද්ගලයින්ගේ ප්‍රජා හා සමාජ විද්‍යාත්මක සාධක සහ ඔවුන් භාවිතා කරන මත්ද්‍රව්‍ය වර්ග අතර පවත්නා සබඳතාව මෙහිදී සාකච්ඡාවට බඳුන් කර ඇත. එහිදී සාමාන්‍ය සමාජය තුළ මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳව ගොඩනගා ගෙන ඇති විවිධ මතවාද සහ සමාජ නිර්මිතයන් මෙන්ම මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන්ගේ විවිධ පැතිකඩ සම්බන්ධයෙන් අවධානය යොමු කර ඇත. විශේෂයෙන් ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව භාවිතයට යොමුවන මත්ද්‍රව්‍යවල විවිධත්වය, වයස් මට්ටම් අනුව වැඩි යොමුවීමක් පෙන්නුම් කරනු ලබන මත්ද්‍රව්‍ය වර්ගයන්, ජනවාර්ගිකත්වය අනුව වැඩි යොමුවීමක් පෙන්නුම් කරන මත්ද්‍රව්‍ය, විවිධ මත්ද්‍රව්‍යයන් සඳහා අධ්‍යාපන මට්ටම් අනුව යොමුවීමේ පවතින විෂමතාවයන් සහ විවාහක අවිවාහක බව අනුව භාවිතයට යොමුවන මත්ද්‍රව්‍ය වර්ගයන් ආදී අංශ කෙරෙහි අවධානය යොමු කරමින් මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් පුළුල් දිශානතියකින් යුක්තව අධ්‍යයනයට ලක් කර ඇත. ඒ සඳහා මූලික

වශයෙන් පාදක කරගෙන ඇත්තේ නියැදිය තුළ සංගෘහිත දත්ත දායකයින්ගේ ප්‍රජා හා සමාජ විද්‍යාත්මක සාධක සහ ඔවුන් විසින් දැනට භාවිතා කරනු ලබන මත්ද්‍රව්‍ය වර්ග සම්බන්ධ දත්තයන්ය.

**ස්ත්‍රී පුරුෂ භාවය සහ මත්ද්‍රව්‍ය භාවිතය**

නියැදියට ඇතුළත් පුද්ගලයින්ගෙන් 1,064 දෙනෙක් පුරුෂයින් වූ අතර 15 දෙනෙක් ස්ත්‍රීන් විය. ඒ අනුව ඔවුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් සංසන්දනාත්මකව විමසීමේදී පැහැදිලිවන කරුණක් නම් අබිං, හෂිස්, රා වර්ග සහ නීත්‍යානුකූල නොවන මත්පැන් වර්ග භාවිතා කිරීමේ ප්‍රවණතාවක් නියැදිය තුළ නියෝජනය වූ කාන්තාවන් අතර නොමැති බවයි.

ප්‍රස්තාර අංක 03 - ස්ත්‍රී පුරුෂ භාවය අනුව මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය




(මූලාශ්‍රය - පර්යේෂණ දත්ත 2016)

නමුත් අධ්‍යයනයට ඇතුළත් වූ කාන්තාවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය තුළ සිගරැට්, නීත්‍යනුකූල මද්‍යසාර, හෙරොයින්, ගංජා සහ පෙති වර්ග වැනි මත්ද්‍රව්‍ය හා මත්පැන් භාවිතය සම්බන්ධයෙන් සුළු ප්‍රවණතාවක් පෙන්නුම් කරයි. ස්ත්‍රී පුරුෂ භාවය අනුව මත්ද්‍රව්‍ය භාවිතය සහ ඒ ආශ්‍රිත ප්‍රවණතාවන්ගේ පවත්නා වෙනස්කම් සම්බන්ධයෙන් අධ්‍යයන ක්ෂේත්‍ර මට්ටමින් (study spots) ඉදිරි පරිච්ඡේද තුළ සාකච්ඡාවට බඳුන් කර ඇත.

**මත්ද්‍රව්‍ය භාවිතය සහ වයස් මට්ටම්**

අධ්‍යයනයේ නියැදිය තුළ නියෝජනය වූ දත්ත දායකයින්ගේ වයස් මට්ටම් සහ ඔවුන් භාවිතා කරන මත්ද්‍රව්‍ය/ මත්පැන් වර්ගයන් පිළිබඳව සංසන්දනාත්මකව අධ්‍යයනය කිරීමේදී තහවුරු වන කරුණු කිහිපයකි. නියැදිය තුළ නියෝජනය වූ පුද්ගලයින් අතුරින් බහුතරයක් එනම්, 40%ක් වයස අවුරුදු 26ත් - 35ත් අතර වයස් කාණ්ඩයට අයත් වූවන්ය.


නීත්‍යානුකූල නොවන මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් සැළකීමේදී නියැදිය තුළ ගංජා භාවිතා කරන සමස්ත පුද්ගලයින්ගෙන් 41%ක් වයස අවුරුදු 26 - 35ත් අතර වයස් කාණ්ඩයට අයත් වූ අතර, 28%ක් වයස අවුරුදු 36 - 50ත් අතර වයස් කාණ්ඩයට අයත් වූවන්ය. ගංජා භාවිතා කරන පුද්ගලයින්ගෙන් 3%ක්

වයස අවුරුදු 18ට අඩු වයස් කාණ්ඩය නියෝජනය කරනු ලබයි. ඒ අනුව නියැදිය තුළ නියෝජනය වූ ගංජා භාවිතා කරන පුද්ගලයින්ගෙන් බහුතරයක් වයස අවුරුදු 26 - 35ත් අතර වයස් කාණ්ඩයට අයත් වූවන්ය.

හෙරොයින් භාවිතා කරන සමස්ත පුද්ගලයින්ගෙන් 39%ක් වයස අවුරුදු 36 - 50ත් අතර ද, 38%ක් වයස අවුරුදු 26 - 35ත් අතර ද, 15%ක් වයස අවුරුදු 19 -25 ත් අතර වයස් කාණ්ඩයටද අයත් වූවන්ය. නියැදිය තුළ නියෝජනය වූ හෙරොයින් භාවිතා කරන පුද්ගලයින්ගෙන් බහුතරයක් වයස අවුරුදු 36ත් 50ත් අතර වයස් කාණ්ඩයට අයත් වූවන්ය.

පෙති වර්ග (ඖෂධ) භාවිතා කරන සමස්ත පුද්ගලයින්ගෙන් 33%ක් වයස අවුරුදු 26 - 35ත් අතර සහ 33%ක් වයස අවුරුදු 36 - 50ත් අතර වයස් කාණ්ඩ වලට අයත් වූවන්ය. පෙති වර්ග භාවිතය සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතු වැදගත් කරුණක් නම්, නියැදිය තුළ නියෝජනය වූ පෙති වර්ග භාවිතා කරන සමස්ත පුද්ගලයින්ගෙන් 25%ක් වයස අවුරුදු 19 - 25ත් අතර වයස් කාණ්ඩයට අයත් තරුණ පුද්ගලයින්වීමයි.

ප්‍රස්තාර අංක 04 - වයස් මට්ටම් සහ මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය - 01





(මූලාශ්‍රය - පර්යේෂණ දත්ත 2016)

නීතිවිරෝධී මද්‍යසාර භාවිතය පිළිබඳ විමසීමේදී පැහැදිලි වන කරුණක් නම්, නියැදිය තුළ නියෝජනය වූ නීතිවිරෝධී මද්‍යසාර භාවිතා කරන සමස්ත පුද්ගල සංඛ්‍යාවෙන් 38%ක් වයස අවුරුදු 26 - 35ත් අතර පුද්ගලයින් වන බවත්, වයස අවුරුදු 36 - 50ත් අතර වයස් කාණ්ඩයට අයත් පුද්ගලයින්ද 38%ක් වන බවත්ය.

නීත්‍යානුකූල මද්‍යසාර භාවිතා කරන සමස්ත පුද්ගල සංඛ්‍යාවෙන් බහුතරයක් එනම්, 42%ක් වයස අවුරුදු 26 - 35ත් අතර වයස් කාණ්ඩය නියෝජනය කරන අතර, සිගරැට් භාවිතා කරන සමස්ත

ජනගහනයෙන් බහුතරයක් එනම්, 40%ක් වයස අවුරුදු 26 - 35ත් අතර වයස් කාණ්ඩය නියෝජනය කරනු ලබයි.

ප්‍රස්තාර අංක 05 - වයස් මට්ටම් සහ මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය - 02





(මූලාශ්‍රය - පර්යේෂණ දත්ත 2016)

**ජන වර්ගය සහ මත්ද්‍රව්‍ය භාවිතය**

ප්‍රජා හා සමාජ විද්‍යාත්මක සාධක සහ මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ සංසන්දනාත්මකව අධ්‍යයනය කිරීමේදී එක් එක් ජනවාර්ගික කණ්ඩායම් සහ එම ජනවාර්ගික කණ්ඩායම් වලට අයත් පුද්ගලයින් භාවිතා කරනු ලබන මත්ද්‍රව්‍ය වර්ග සහ භාවිත රටා කෙරෙහි අවධානය යොමු කළ යුතුය. එක් එක් ජනවාර්ගික කණ්ඩායම් තුළ අන්තර්ගත සංස්කෘතික පසුබිම් වල බලපෑම මත ඔවුන් යොමු වන සහ තෝරා ගන්නා මත්ද්‍රව්‍ය වර්ගයන් වෙනස් විය හැකිය. එමෙන්ම එයට සමාජ පාරිසරික සාධකද බලපෑම් කරනු ලබයි. අධ්‍යයන ක්ෂේත්‍රයන් අතුරින් අහඹු ලෙස නියැදියට ඇතුළත් කර ගන්නා ලද දත්ත දායකයින් අතුරින් 76%ක් සිංහල ජන වර්ගයද, 12%ක් ද්‍රවිඩ ජනවර්ගයද සහ 10%ක් මුස්ලිම් ජනවර්ගයද නියෝජනය කරන ලදී.

අධ්‍යයනයෙන් ලද දත්ත වලට අනුව දත්ත දායකයින් බහුවිධ මත්ද්‍රව්‍ය භාවිතය (Multiple drug use) සඳහා යොමු වූවන් බව තහවුරු වූ අතර ඒ අනුව ඔවුන් මත්ද්‍රව්‍ය හෝ මත්පැන් වර්ග දෙකක් හෝ කිහිපයක් භාවිතා කරනු ලබයි. බහුවිධ මත්ද්‍රව්‍ය වර්ග භාවිතය සැළකිල්ලට ගනිමින් එය එක් එක් ජනවර්ගය අනුව කෙසේ ව්‍යාප්ත වී ඇත්ද යන්න ගැන මෙහිදී විශ්ලේෂණයට ලක් කරන ලදී. ඒ අනුව පැහැදිලි වූ කරුණක් නම්, සියලුම ජනවර්ග අතර සිගරට් භාවිතය සඳහා ඉහළ ප්‍රවණතාවක් පවතින බවයි. නීත්‍යානුකූල මද්‍යසාර භාවිතය සම්බන්ධයෙන් සැළකීමේදී ද්‍රවිඩ ජන වර්ගය අතර ඉහළ ප්‍රවණතාවක් දැක ගත හැකිය. එමෙන්ම නීතිවිරෝධී මද්‍යසාර භාවිතය සම්බන්ධයෙන්ද ද්‍රවිඩ ජන වර්ගය තුළ ඉහළ ප්‍රවණතාවක් පෙන්නුම් කරයි.


ප්‍රස්තාර අංක 06 - ජනවර්ග අනුව මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය




(මූලාශ්‍රය - පර්යේෂණ දත්ත 2016)

ගංජා, හෙරොයින් සහ පෙති වර්ග භාවිතය පිළිබඳව අවධානය යොමු කිරීමේදී ගම්‍ය වන කරුණක් නම් නියැදිය තුළ නියෝජනය වූ එක් එක් ජනවර්ගයට අයත් සංයුතියට සාපේක්ෂව ගංජා භාවිතය සඳහා ඉහළ ප්‍රවණතාවක් ද්‍රවිඩ ජන වර්ගය තුළ පෙන්නුම් කරන අතර, හොරොයින් භාවිතය සඳහා ඉහළ ප්‍රවණතාවක් මුස්ලිම් ජන වර්ගය තුළ නිරූපනය වෙයි. නියැදිය තුළ නියෝජනය වූ සිංහල ජන වර්ගයට අයත් පුද්ගලයින් අතුරින් 65%ක් ගංජා භාවිතා කරනු ලබන අතර 42%ක් හෙරොයින් භාවිතා කරනු ලබයි. නියැදියට අනුව ගංජා සහ හෙරොයින් යන මත්ද්‍රව්‍ය වර්ගයන් අතුරින් සිංහල ජන වර්ගය තුළ වැඩි ප්‍රවණතාවක් ගංජා සඳහා පවතින බව පැහැදිලි වේ. නියැදිය තුළ නියෝජනය වූ මුස්ලිම් ජන වර්ගයට අයත් පුද්ගලයින් අතුරින් 59%ක් ගංජා භාවිත කරනු ලබන අතර, 57%ක් හෙරොයින් භාවිතා කරනු ලබයි. එමෙන්ම ද්‍රවිඩ ජන වර්ගයට අයත් පුද්ගලයින් අතුරින් 77%ක් ගංජා භාවිතා කරනු ලබන අතර, 26%ක් හෙරොයින් භාවිතා කරනු ලබයි.

ප්‍රස්තාර අංක 07 - ජනවර්ග අනුව මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය 02




(මූලාශ්‍රය - පර්යේෂණ දත්ත 2016)

ඒ අනුව හෙරොයින් භාවිතය සම්බන්ධයෙන් ඉහළ ප්‍රවණතාවක් මුස්ලිම් ජන වර්ගය තුළ පෙන්නුම් කරන අතර, දෙමළ ජන වර්ගය තුළ අඩු ප්‍රවණතාවක් පෙන්නුම් කරනු ලබයි. ගංජා භාවිතය සම්බන්ධයෙන් ද්‍රවිඩ ජන වර්ගය අතර ඉහළ ප්‍රවණතාවක් පෙන්නුම් කරන අතර, මුස්ලිම් ජන වර්ගය තුළ අඩු ප්‍රවණතාවක් පෙන්නුම් කරනු ලබයි.


**අධ්‍යාපන මට්ටම සහ මත්ද්‍රව්‍ය භාවිතය**

පුද්ගලයෙකුගේ අධ්‍යාපන මට්ටම සහ මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වීම අතර යම් සම්බන්ධතාවක් ඇත. අධ්‍යාපනයේ විවිධ පරිසාධන මට්ටම් කරා ළඟා වීම තුළ කුසලතාවන් මෙන්ම අවදානම පිළිබඳ පරිකල්පන හැකියාවද වැඩි දියුණු වෙයි. අධ්‍යාපනය තුළ අවශ්‍ය පරිසාධන මට්ටම් කරා ළඟා වීමට නොහැකි වීම තුළ අවදානම පිළිබඳව ගොඩනැගෙන සංජානනයද හීන වී යයි. එවිට සෞඛ්‍යමය, ආර්ථිකමය හෝ සමාජීය වශයෙන් පවත්නා අවදානම් තත්ත්වයන් ගැන නොතකා විවිධ චර්යාවන් සහ ක්‍රියාකාරකම් වල නිරත වෙයි. මත්ද්‍රව්‍ය භාවිතයද මේ අතර ප්‍රධාන තැනක් ගනියි.

නියැදිය තුළ නියෝජනය වූ දත්ත දායකයින්ගේ අධ්‍යාපන මට්ටම් සහ ඔවුන්ගේ මත්ද්‍රව්‍ය භාවිත රටාසංසන්දනය කිරීමේදී පැහැදිලි වන කරුණක් නම්, බොහෝ මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වී සිටින පුද්ගලයින් අවම අධ්‍යාපන මට්ටමක් සහිත පුද්ගලයින්ය. නියැදිය තුළ සංගෘහිත සිගරැට් හා නීත්‍යනුකූල මද්‍යසාර භාවිතා කරන සමස්ත පුද්ගලයින් අතුරින් බහුතරයක් ද්විතියික අධ්‍යාපන මට්ටම දක්වා පමණක් අධ්‍යාපනය ලද පුද්ගලයින්ය. සිගරැට් භාවිතා කරන සමස්ත පුද්ගලයින්ගෙන් 64%ක් ද්විතියික අධ්‍යාපනය හෝ ඊට වඩා පහළ අධ්‍යාපන මට්ටමක් සාධනය කර ගත් පුද්ගලයින්ය. මද්‍යසාර භාවිතා කරන පුද්ගලයින්ගෙන් 60%ක් ද්විතියික අධ්‍යාපනය හෝ ඊට වඩා පහළ අධ්‍යාපන මට්ටමක් සාධනය කර ගත් පුද්ගලයින්ය. නියැදිය තුළ නියෝජනය වූ නීතිවිරෝධී මද්‍යසාර භාවිතා කරන පුද්ගලයින්ගේ අධ්‍යාපන මට්ටම පිළිබඳ අධ්‍යයනය කිරීමේදී පැහැදිලි වන්නේ, බහුතරයක්

එනම් 70%ක් ද්විතියික අධ්‍යාපනය හෝ ඊට පහළ අධ්‍යාපන මට්ටමක් සාධනය කර ගත් පුද්ගලයින්ය.


ප්‍රස්තාර අංක 08 - අධ්‍යාපන මට්ටම අනුව අනුව මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය




(මූලාශ්‍රය - පර්යේෂණ දත්ත 2016)

නියැදිය තුළ ගංජා සහ හෙරොයින් භාවිතා කරන පුද්ගලයින්ගේ අධ්‍යාපන මට්ටම් පිළිබඳ අධ්‍යයනය කිරීමේදී පැහැදිලි වන කරුණක් නම්, බහුතරයක් ද්විතියික අධ්‍යාපනය දක්වා අධ්‍යාපනය ලද පුද්ගලයින් බවයි. ගංජා භාවිතා කරන පුද්ගලයින්ගෙන් 39%ක් ද, හෙරොයින් භාවිතා කරන පුද්ගලයින්ගෙන් 42%ක් ද, ද්විතියික මට්ටම දක්වා අධ්‍යාපනය ලද පුද්ගලයින්ය. අ:පොෘසඃ සාඃපෙළ විභාගය සමත් හෝ ඊට ඉහළ මට්ටමක අධ්‍යාපනය ලද පුද්ගලයින් මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වීමේ තරමක් අඩු ප්‍රවණතාවක් පෙන්නුම් කරයි. අධ්‍යයන දත්ත වලට අනුව උපාධියක් ලබා ගැනීමේ හෝ ඊට ඉහළ මට්ටමක අධ්‍යාපනයක් සාධනය කර ගත් පුද්ගලයින් මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වී ඇත්තේ ඉතා සුළු වශයෙනි.

ප්‍රස්තාර අංක 09 - අධ්‍යාපන මට්ටම අනුව මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය





(මූලාශ්‍රය - පර්යේෂණ දත්ත 2016)

**විවාහක අවිවාහක බව සහ මත්ද්‍රව්‍ය භාවිතය**

අධ්‍යයනයේ නියැදිය තුළ නියෝජනය වූ පුද්ගලයින්ගේ මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ තොරතුරු සහ ඔවුන්ගේ විවාහක අවිවාහක බව අතර යම් සම්බන්ධතාවක් හඳුනා ගත හැකිය. නියැදිය තුළ නියෝජනය වූ හෙරොයින් භාවිතා කරන පුද්ගලයින්ගෙන් 48%ක් අවිවාහක පුද්ගලයින් වන අතර, ගංජා භාවිතා කරන ලද මුළු පුද්ගලයින්ගෙන් බහුතරයක් එනම්, 50%ක් විවාහක පුද්ගලයින්ය. තවද, පෙති වර්ග භාවිත කරන පුද්ගලයින්ගෙන් 58%ක් අවිවාහක පුද්ගලයින්ය.


ප්‍රස්තාර අංක 10 - විවාහක අවිවාහක බව අනුව මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය




(මූලාශ්‍රය - පර්යේෂණ දත්ත 2016)

සිගරට් සහ මද්‍යසාර භාවිතා කරන පුද්ගලයින් සම්බන්ධයෙන් සැළකීමේදී බහුතරයක් එනම්, සිගරට් භාවිතා කරන්නන්ගෙන් 48%ක් සහ මද්‍යසාර භාවිතා කරන්නන්ගෙන් 56%ක් විවාහක පුද්ගලයින් වේ. නීතිවිරෝධී මද්‍යසාර භාවිතා කරන පුද්ගලයින්ගෙන් බහුතරයක් එනම්, 59%ක් විවාහක පුද්ගලයින් වේ.

ප්‍රස්තාර අංක 11 - විවාහක අවිවාහක බව අනුව මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය





(මූලාශ්‍රය - පර්යේෂණ දත්ත 2016)

මත්ද්‍රව්‍ය ඇබ්බැහිකාරීත්වය සඳහා වූ ප්‍රතිකාර වලට යොමුවීම් සම්බන්ධ දත්ත විමර්ශනය කිරීමේදී ද තහවුරු වන කරුණක් නම්, පසුගිය වර්ෂවල මත්ද්‍රව්‍ය ඇබ්බැහිකාරීත්වය සඳහා වූ ප්‍රතිකාර ක්‍රියාවලියට යොමු වූ පුද්ගලයින්ගෙන් බහුතරයක් අවිවාහක පුද්ගලයින්ය. 2014 වර්ෂයේ ප්‍රතිකාර සඳහා ඇතුළත් වූ මුළු පුද්ගලයින්ගෙන් 50%ක් අවිවාහක පුද්ගලයින් වන අතර 2015 වර්ෂය තුළ ප්‍රතිකාර සඳහා ඇතුළත් වූ පුද්ගලයින්ගෙන් 48%ක් අවිවාහක පුද්ගලයින්ය. (මත්ද්‍රව්‍ය දුර්භාවිත අත්පොත - 2016)

### රැකියාව සහ මත්ද්‍රව්‍ය භාවිතය

අධ්‍යයනයේ නියැදිය තුළ නියෝජනය වූ දත්ත දායකයින්ගේ රැකියා සම්බන්ධයෙන් විශ්ලේෂණය කිරීමේදී වැදගත් කරුණු කිහිපයක් හඳුනා ගත හැකිය. නියැදිය තුළ නියෝජනය වූ හෙරොයින් භාවිතා කරන පුද්ගලයින් අතුරින් 30%ක් නුපුහුණු ශ්‍රමිකයින් ලෙස කටයුතු කරන පුද්ගලයින් විය. ඊට අමතරව 16%ක් වෙළඳාමෙහි නිරත වන පුද්ගලයින් වූ අතර 10%ක් ප්‍රවාහන සේවකයින් ලෙස කටයුතු කරනු ලබයි. ගංජා භාවිතා කරන පුද්ගලයින්ගේ රැකියාවන් හෝ වෘත්තීන් පිළිබඳව සළකන විට බහුතරයක් පුද්ගලයින් එනම්, 24%ක් පුහුණු ශ්‍රමිකයින් ලෙසත් 24%ක් නුපුහුණු ශ්‍රමිකයින් ලෙසත් රැකියාවේ නිරත වන අතර ගංජා භාවිතා කරන පුද්ගලයින්ගෙන් 18%ක් ප්‍රවාහන සේවකයින් ලෙස රැකියාවේ නිරත වෙයි.

ප්‍රස්තාර අංක 12 - රැකියාව සහ මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය




(මූලාශ්‍රය - පර්යේෂණ දත්ත 2016)

## ප්‍රතිඵල


### මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය

අධ්‍යයනය තුළ අවධානය යොමු කරන ලද ප්‍රධාන අංශ දෙකකි. එනම්, මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය සහ මත්ද්‍රව්‍ය භාවිතය ආශ්‍රිත නූතන ප්‍රවණතා සම්බන්ධයෙනි. මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය සම්බන්ධයෙන් කරන ලද අධ්‍යයනය ප්‍රධාන තේමා සහ අංශ කිහිපයක් වෙත දිශාගත කරන ලදි. මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය සම්බන්ධයෙන් කරන ලද අධ්‍යයනයන් තුළ අදාළ මත්ද්‍රව්‍ය වර්ගයන්, භාවිතා කරන එනම් ශරීරගත කර ගන්නා ක්‍රම සහ ඒවාට පුද්ගලයින් දක්වන රුචිකත්වය, මත්ද්‍රව්‍ය භාවිත රටා, භාවිතා කරන ප්‍රමාණයන් හා මිල ගණන්, ප්‍රදේශ අනුව මත්ද්‍රව්‍ය අලෙවිය සහ ඒවා ලබා ගැනීමට ඇති අවකාශය පිළිබඳව තොරතුරු ගවේෂණය කරන ලදි. ප්‍රදේශ අනුව එක් එක් නිර්ණායකයන්ගේ පවතින විෂමතා ඒ හරහා හඳුනා ගැනීමට අවකාශය සැළසිණි.

#### හෙරොයින් භාවිතයේ ව්‍යාප්තිය සහ ඒ ආශ්‍රිත කාලීන තත්ත්වය

අධ්‍යයනයේ නියැදිය තුළ නියෝජනය වූ පුද්ගලයින් අතුරින් 455 (42%) ක් දැනට හෙරොයින් භාවිතා කරන පුද්ගලයින්ය. ඔවුන් හෙරොයින් ශරීරගත කර ගැනීම සඳහා ක්‍රම කිහිපයක් අනුගමනය කරනු ලබයි. දුමක් ලෙස භාවිතා කිරීම හෙවත් චයිනීස් ක්‍රමය, එන්නත් කර ගැනීම සහ නාසයෙන් ඉරීම යන ප්‍රධාන ක්‍රම භාවිතා කරමින් හෙරොයින් ශරීරගත කරගනු ලබයි. නියැදිය තුළ නියෝජනය වූ හෙරොයින් භාවිතා කරන පුද්ගලයින්ගෙන් බහුතරයක් (38%) ක් චයිනීස් ක්‍රමය ද, 6% ක් එන්නත් කිරීමේ ක්‍රමයද භාවිත කරනු ලබයි. ඉතා සුලු පිරිසක් (0.3%) ක් නාසයෙන් ඉරීමේ ක්‍රමය භාවිතා කරනු ලබයි. ඇතැම් පුද්ගලයින් අවස්ථානුකූලව ඉහත ක්‍රම අතුරින් එකක් හෝ කිහිපයක් භාවිතා කරනු ලබයි.

ප්‍රස්තාර අංක 13 - හෙරොයින් ශරීරගත කර ගැනීම සඳහා අනුගමනය කරනු ලබන ක්‍රමවල ව්‍යාප්තිය





(මූලාශ්‍රය - පර්යේෂණ දත්ත 2016)

පසුගිය අධ්‍යයනයන්ගෙන් ද තහවුරු වූ ආකාරයට හෙරොයින් භාවිතා කරන ජනගහනය අතර මත්ද්‍රව්‍ය ශරීරගත කර ගන්නා ප්‍රචලිත ක්‍රමය බවට පත්ව ඇත්තේ, චයිනීස් (chases the Dragon) ක්‍රමයයි. එන්නත් කිරීම මගින් මත්ද්‍රව්‍ය ශරීරගත කර ගන්නා පුද්ගලයින්ගෙන් 7 (0.6%) ක් හෙරොයින් වලට අමතරව මෝර්ෆීන් සල්ෆේට් එන්නත් මගින් ශරීරගත කරගනු ලබයි.

හෙරොයින් භාවිතා කිරීම සඳහා පුද්ගලයින් විසින් අනුගමනය කරනු ලබන විවිධ ක්‍රම වල ව්‍යාප්තිය දිවයිනේ විවිධ ප්‍රදේශ මට්ටමින් සැළකීමේදී පැහැදිළි වෙනස්කම් හඳුනා ගත හැකිය. විශේෂයෙන් එන්නත් කිරීම මගින් හෙරොයින් භාවිතා කිරීමේ ක්‍රමයේ ඉහළ ව්‍යාප්තියක් කොළඹ දිස්ත්‍රික්කය තුළ හඳුනා ගත හැකිය. පහත සිතියම මගින් තෝරාගත් දිස්ත්‍රික්ක කිහිපයක හෙරොයින් ශරීරගත කර ගැනීම සඳහා පුද්ගලයින් විසින් භාවිතා කරන ක්‍රමවල ව්‍යාප්තිය නිරූපණය කර ඇත.

සිතියම් අංක 02 - හෙරොයින් ශරීරගත කර ගැනීම සඳහා පුද්ගලයින් විසින් භාවිතා කරන ක්‍රමවල ව්‍යාප්තිය




(මූලාශ්‍රය - පර්යේෂණ දත්ත 2016)

චයිනීස් ක්‍රමය භාවිතා කරමින් හෙරොයින් ශරීරගත කර ගන්නා පුද්ගලයින්ගේ මත්ද්‍රව්‍ය භාවිත රටාකෙරෙහි අවධානය යොමු කිරීමේදී විවිධත්වයක් දැකගත හැකි විය. එනම් දිනපතා, සතියකට යම් වාර ගණනක් හෝ සති දෙකකට වරක් වශයෙන් භාවිතයේ රටාවන් පුළුල් පරාසයක් තුළ ව්‍යාප්ත වී ඇත. නියැදිය තුළ නියෝජනය වූ චයිනීස් ක්‍රමය මඟින් හෙරොයින් ශරීරගත කර ගන්නා පුද්ගලයින්ගෙන් 377 (95%) ක් දිනපතා චයිනීස් ක්‍රමය මඟින් හෙරොයින් භාවිතා කරනු ලබයි. ඔවුන් දිනකට හෙරොයින් භාවිතා කරන වාර ගණන පිළිබඳ සැළකීමේදී පුද්ගලයින් 118 (31%) ක් දිනකට තුන් වරක් හෙරොයින් භාවිතා කරන පුද්ගලයින් වූ අතර 43 (11%) දෙනෙක් දිනකට වාර හතරක් ද, 14 දෙනෙක් දිනකට වාර පහක් ද සහ 9 දෙනෙක් දිනකට වාර හයක් බැගින් ද හෙරොයින් භාවිතා කරනු ලබයි. චයිනීස් ක්‍රමය මඟින් හෙරොයින් භාවිතා කරන පුද්ගලයින්ගෙන් 29 (7%) ක් සතියකට වරක් හෝ කිහිපවරක් හෙරොයින් භාවිතා කරන පුද්ගලයින්ය. චයිනීස් ක්‍රමය මඟින් දිනපතා හෙරොයින් භාවිතා කරන පුද්ගලයින් දිනකට හෙරොයින් භාවිතා කරන සාමාන්‍ය වාර ගණන 03 කි.

හෙරොයින් භාවිතා කරන පුද්ගලයින් සිය දෛනික මත්ද්‍රව්‍ය අවශ්‍යතාව සපුරා ගැනීම සඳහා මත්ද්‍රව්‍ය අලෙවිකරුවන් සමඟ ගොඩනඟා ගන්නා සබඳතාවන් මත හෙරොයින් මිලදී ගැනීම සිදු කරයි. හෙරොයින් අලෙවියේ නිරත පුද්ගලයින් ජාලයක් ලෙස ක්‍රියාත්මක වෙයි. එහි ඉහළ ස්ථරයේ සිටින පුද්ගලයින් මහා පරිමාණ වශයෙන් හෙරොයින් ජාවාරම් කරනු ලබන අතර පහළ ස්ථර වල සිටින පුද්ගලයින් අතට ඒවා විවිධ ප්‍රමාණයන්ගෙන් සංසරණය වීම සිදුවෙයි. වීථි මට්ටමේ හෙරොයින් අලෙවිකරුවන් අතට පත්වන හෙරොයින් තමා යටතේ සිටින පාරිභෝගිකයින් සඳහා අලෙවි කරනු ලබයි. එහිදී භාවිතා කිරීමට පහසු වන ලෙස සකසන ලද කුඩා පැකට් ලෙස අලෙවි කරනු ලබන අතර එම පැකට්වල අන්තර්ගත හෙරොයින් ප්‍රමාණය ප්‍රදේශයෙන් ප්‍රදේශයට වෙනස් විය හැකිය. එම පැකට් වලට මිලක් නියම කිරීමේදී එහි අන්තර්ගත ප්‍රමාණය ගැන බොහෝවිට නොසළකයි. භාවිතා කිරීම සඳහා සකසන ලද පැකට්වල මිල ගණන් ද ප්‍රදේශ අනුව වෙනස් වෙයි.


අධ්‍යයනයේ නියැදිය තුළ නියෝජනය වූ පුද්ගලයින්ගෙන් 112 (26%) ක් දිනකට හෙරොයින් පැකට් එකක් ද, 125 (29%) දිනකට හෙරොයින් පැකට් දෙකක් ද සහ 101 (23%) දෙනෙක් දිනකට හෙරොයින් පැකට් තුනක් ද භාවිතා කරනු ලබයි. ඊට අමතරව දිනකට පැකට් 6ක් භාවිතා කරන පුද්ගලයින් 18 දෙනෙක් සහ පැකට් 5ක් භාවිතා කරන පුද්ගලයින් 14 දෙනෙක් ද හඳුනාගත හැකි විය. දත්ත වලට අනුව බහුතරයක් පුද්ගලයින් දිනකට හෙරොයින් පැකට් දෙකක් භාවිතා කරන අතර හෙරොයින් භාවිතා කරන පුද්ගලයෙක් දිනකට භාවිතා කරන සාමාන්‍ය හෙරොයින් පැකට් ගණන 03 කි.

යම් පුද්ගලයෙක් එක් වරකදී භාවිතා කරනු ලබන හෙරොයින් පැකට් එකක (one time dose) අන්තර්ගත හෙරොයින් ප්‍රමාණය දළ වශයෙන් මිලිග්‍රෑම් (mg) වලින් මිනුම් කිරීමේදී බහුතරයක් පුද්ගලයින් භාවිතා කරන පැකට්වල අන්තර්ගත හෙරොයින් ප්‍රමාණය ලෙස දක්වා ඇත්තේ 20mg කි. පුද්ගලයින් 88 දෙනෙක් 15mg ක් හෝ ඊට අඩු බර ප්‍රමාණයන්ගෙන් යුත් පැකට් භාවිතා කර ඇති අතර 16mg සිට 29mg දක්වා ප්‍රමාණයන්ගෙන් යුත් පැකට් භාවිතා කරන පුද්ගලයින් 102ක් නියැදිය තුළ නියෝජනය විය.

**හෙරොයින් වෙනුවට භාවිතා කරන විකල්ප මත්ද්‍රව්‍ය**

ඇතැම් අවස්ථාවල හෙරොයින් සඳහා ඇබ්බැහි වූ පුද්ගලයින් සිය දෛනික අවශ්‍යතාවන්ට අනුව අවශ්‍ය හෙරොයින් ප්‍රමාණය සපයා ගත නොහැකි වූ විට වෙනත් විකල්ප මත්ද්‍රව්‍ය (alternative drugs) වෙත යොමු වෙයි. එසේ යොමු වන වෙනත් විකල්ප ද්‍රව්‍යය සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමේදී බොහෝ පුද්ගලයින් හෙරොයින් නොමැති අවස්ථාවල එවැනි විකල්ප ද්‍රව්‍ය එකක් හෝ කිහිපයක් භාවිතා කිරීමට යොමු වී ඇත. ඒ අතරින් Morphine පෙති බහුතරයක් විසින් භාවිතා කරනු ලැබ ඇත. ඊට අමතරව Tramadol, Rohypnol, Diazepam, Artane සහ pregaballin වැනි පෙති වර්ග ද හෙරොයින් වලට විකල්ප ද්‍රව්‍යය ලෙස බොහෝ පුද්ගලයින් විසින් භාවිතා කර ඇත.

ප්‍රස්තාර අංක 14 - හෙරොයින් වෙනුවට භාවිතා කරන විකල්ප මත්ද්‍රව්‍ය




(මූලාශ්‍රය - පර්යේෂණ දත්ත 2016)

පෙති වර්ග වලට අමතරව මද්‍යසාර සහ සිගරැට් අධික ලෙස භාවිතය ද ඇතැම් පුද්ගලයින් හෙරොයින් වලට විකල්පයක් ලෙස අනුගමනය කරනු ලබයි. නියැදිය තුළ නියෝජනය වූ පුද්ගලයින්ගෙන් 4%ක් හෙරොයින් නොමැති අවස්ථාවල විකල්පයක් ලෙස මද්‍යසාර භාවිතා කරඇත.

**හෙරොයින් වල මිල ගණන් සහ ලබා ගැනීමට ඇති අවකාශය**

වීථි මට්ටමේ හෙරොයින් වෙළඳපොළ තුළ භාවිතා කිරීමට සකසන ලද කොටසක මිල ගණන්වල ප්‍රදේශයෙන් ප්‍රදේශයට යම් වෙනසක් හඳුනා ගත හැකිය. අධ්‍යයනයේ නියැදිය තුළ නියෝජනය වූ පුද්ගලයින්ගෙන් බහුතරයක් එනම්, 156 (36%) ක් තමන් දිනකට භාවිතයට ගන්නා හෙරොයින් ප්‍රමාණයක මිල රු. 1000.00 ක් ලෙස සඳහන් කර ඇත. ඇස්තමේන්තු ගත වීදි මට්ටමේ හෙරොයින් කිලෝ ග්‍රෑම් එකක මිල හා සැසඳීමේදී මීට වඩා වෙනස් තත්ත්වයක් හඳුනාගත හැකිය. ඊට හේතුව වන්නේ හෙරොයින් භාවිතා කරන පුද්ගලයන් සිය අවශ්‍යතාවන් සඳහා අලෙවිකරුවන්ගෙන් මිලදී ගන්නා හෙරොයින් ප්‍රමාණ විවිධ වන නිසා සහ එක්වරකට භාවිතා කිරීම සඳහා සකසන ලද විවිධ බර ප්‍රමාණයන්ගෙන් යුත් කොටස් වශයෙන් හෙරොයින් අලෙවි කරනු ලබන නිසාත් ය. මත්ද්‍රව්‍ය ලබාගැනීමට ඇති අවකාශය හා හැකියාව මත මිල ගණන් සහ ප්‍රමාණ වෙනස්විය හැකි ය.

භාවිතා කිරීමේ සහ අලෙවි කිරීමේ පහසුව අනුව වීථි මට්ටමේ හෙරොයින් අලෙවිකරුවන් විසින් මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන්ට අලෙවි කරනු ලබන මත්ද්‍රව්‍ය ප්‍රමාණයක මිලෙහි සාමාන්‍ය රුː 1025.00 ක් ලෙස සැලකිය හැකි අතර එය ඇතැම්විට රුː 5000.00 ක උපරිම මිල දක්වා වන අවස්ථාද ඇත. දිනපතා හෙරොයින් භාවිතා කරන පුද්ගලයෙක් සිය මත්ද්‍රව්‍ය අවශ්‍යතාව සඳහා දිනකට වැයකරන සාමාන්‍ය මුදල රු. 2500 ත් 2600 ත් අතර වන බව අධ්‍යයනයේ දත්ත තුළින් අනාවරණය විය.

හෙරොයින් භාවිතයට යොමුවී සිටින පුද්ගලයින් තමන්ට අවශ්‍ය හෙරොයින් ලබාගැනීමේදී බහුතරයක් ඍජුවම අලෙවි කරන පුද්ගලයින්ගෙන් ලබාගන්නා අතර මිතුරන් හෝ වෙනත් හඳුනන පුද්ගලයන් මාර්ගයෙන් මත්ද්‍රව්‍යය මිලදී ගනියි. වීදි මට්ටමේ හෙරොයින් අලෙවි කරන අලෙවිකරුව කුගෙන් හෙරොයින් ලබාගැනීමේදී ඔහු කලින් හඳුනාගත් නිශ්චිත කණ්ඩායමකට පමණක් හෙරොයින් ලබාදෙන අතර ආගන්තුක පුද්ගලයන්ට අලෙවි නොකරයි. එය නීතියේ රැහැනින් මිදීම සඳහා ඔවුන් විසින් සකසාගත් උපක්‍රමයක් බව තහවුරු විය. වීථි මට්ටමේ හෙරොයින් අලෙවිකරන පුද්ගලයින් මහා පරිමාණ ජාවාරම්කරුවන්ගෙන් හෙරොයින් ලබා ගැනීමේදී දුරකථන මාර්ග වලින් ගනුදෙනු කරමින් මත්ද්‍රව්‍ය අලෙවි කරන අතර ඔවුන් ඇතැම්විට එකිනෙකා නොහඳුනන අතර වක්‍රාකාරයෙන් එය සිදුකරයි.

**ගංජා භාවිතයේ ව්‍යාප්තිය සහ ඒ ආශ්‍රිත කාලීන තත්ත්වය**

නියැදිය තුළ නියෝජනය වූ පුද්ගලයින්ගෙන් 711 (60%) ක් ගංජා භාවිතා කරන පුද්ගලයින්ය. ඔවුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධ රටා පිළිබඳව අධ්‍යයනය කිරීමේදී දිනපතා භාවිතා කරන පිරිස් සහ අවස්ථානුකූලව භාවිතා කරන පාර්ශ්වද හඳුනාගත හැකි විය. අධ්‍යයනයේ නියැදිය තුළ නියෝජනය වූ පුද්ගලයින්ගෙන් 409 දෙනෙක් දිනපතා භාවිතා කරන්නන් වන අතර 193 දෙනෙක් සතිපතා ද, 54 දෙනෙක් කලාතුරකින් ද ගංජා භාවිතා කරනු ලබන බව අනාවරණය විය. දිනපතා ගංජා භාවිතා කරන පුද්ගලයින් ඔවුන් දිනකට භාවිතා කරන වාර ගණන පිළිබඳ අවධානය යොමු කිරීමේදී දිනපතා ගංජා භාවිතා කරන පුද්ගලයින්ගෙන් 120 (29%) ක් දෙනෙක් දිනකට එක් වරක් ද, 95 (23%) දෙනෙක් දිනකට වාර දෙකක් සහ 55 (13%) දෙනෙක් දිනකට වාර තුනක් ගංජා භාවිතා කරන පුද්ගලයින්ය. නියැදිය තුළ නියෝජනය වූ ගංජා භාවිතා කරන පුද්ගලයින් දිනකට භාවිතා කරනු ලබන ගංජා පැකට් ප්‍රමාණය පිළිබඳව අධ්‍යයනය කිරීමේදී යම් පුද්ගලයෙක් දිනකට භාවිතා කරනු ලබන සාමාන්‍ය පැකට් ගණන එකකි. එනම් බහුතර පිරිසක් දිනකට පැකට් එකක් භාවිතා කරන අතර මෙහිදී පැකට් එකක් යන්න භාවිතා කිරීමේ පහසුව සඳහා සහ දෛනිකව පහසුවෙන් අලෙවි කිරීමේ හා හුවමාරු කර ගැනීමේ පහසුව පිළිබඳ සලකමින් සකසන ලද ප්‍රමාණයකි. දත්ත දායකයින් හෙළි කරන ආකාරයට ඔවුන් එසේ ලබා ගන්නා ප්‍රමාණය දවසේ විවිධ වේලාවන් තුළ කොටස් වශයෙන් භාවිතා කරන අවස්ථාද ඇත.

භාවිතා කිරීම සඳහා ලබා ගන්නා ගංජා කොටසක මිල පිළිබඳව අධ්‍යයනය කිරීමේදී එය රු. 200 - 300 අතර මිලක් විය. එහිදී බහුතරයක් පුද්ගලයින් ලබා ගන්නා ගංජා ප්‍රමාණයක මිල වූයේ රු. 200 කි. මෙය ප්‍රදේශ අනුව වෙනස් වන අතර එය සුලභතාවය මත තීරණය වන්නකි.


දිනපතා ගංජා භාවිතා කරන පුද්ගලයින් සිය දෛනික අවශ්‍යතාව සඳහා අවශ්‍ය ගංජා ලබා ගන්නා ආකාරය පිළිබඳ සැළකීමේදී ප්‍රධාන වශයෙන් ක්‍රම කිහිපයක් ඔස්සේ ඔවුන් මත්ද්‍රව්‍ය සපයා ගනු

ලබයි. ඒ අතර සෘජුවම මත්ද්‍රව්‍ය අලෙවි කරන පුද්ගලයින්ගෙන් ලබා ගැනීම සහ මිතුරන් මාර්ගයෙන් ලබා ගැනීම සිදු කරනු ලබයි. එසේ මත්ද්‍රව්‍ය මිලදී ගැනීමේදී දිනකට අවශ්‍ය ප්‍රමාණය පමණක් මිලදී ගැනීම සිදු කරන අතර කලාතුරකින් අවස්ථාවකදී දෛනික අවශ්‍ය ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයක් මිලදී ගනු ලබයි. දිනපතා ගංජා භාවිතා කරන පුද්ගලයෙක් සිය මත්ද්‍රව්‍ය භාවිතය සඳහා දිනකට වැය කරනු ලබන සාමාන්‍ය මුදල් ප්‍රමාණය රුපියල් 550ක් බව අනාවරණය විය.

**පෙති වර්ග භාවිතය පිළිබඳ තත්ත්වය**

අධ්‍යයනය තුළ නියෝජනය වූ දත්ත දායකයින්ගෙන් 72 (7%) ක් පෙති වර්ග භාවිතා කරන පුද්ගලයින් වූ අතර එයින් 16 දෙනෙක් දිනපතා පෙති වර්ග භාවිතා කරන පුද්ගලයින්ය. ඔවුන් විසින් භාවිතා කරනු ලබන පෙති වර්ග පිළිබඳ විමසීමේදී බොහෝ පුද්ගලයින් පෙති වර්ග එකක් හෝ කිහිපයක් භාවිතා කරනු ලබයි. ඒ අනුව බහුතරයක් පුද්ගලයින් විසින් එනම් නියැදිය තුළ නියෝජනය වූ පෙති වර්ග භාවිතා කරන පුද්ගලයින්ගෙන් 50 දෙනෙක් Pseudoephedrine පෙති වර්ගය භාවිතා කරනු ලබයි. ඊට අමතරව Tramodol භාවිතා කරන පුද්ගලයින් 39 දෙනෙක් Morphine පෙති භාවිතා කරන පුද්ගලයින් 36 දෙනෙක් සහ Diazapam භාවිතා කරන පුද්ගලයින් 31 දෙනෙක් ද නියැදිය තුළ නියෝජනය විය.

ප්‍රස්තාර අංක 15 - නියැදිය තුළ නියෝජනයවූ පෙති වර්ග භාවිතා කරන පුද්ගලයින්ගේ සංයුතිය




(මූලාශ්‍රය - පර්යේෂණ දත්ත 2016)

අධ්‍යයන අනාවරණයන්ට අනුව පෙති වර්ග භාවිතා කරන පුද්ගලයින් පෞද්ගලිකව හඳුනන හෝ සබඳතා ගොඩනගා ගෙන සිටින ඖෂධ සැල් මගින් පෙති වර්ග සෘජුවම ලබා ගැනීම බොහෝවිට සිදු කරන අතර ඇතැම් අවස්ථාවල රෝගීන්ට වෛද්‍යවරුන් විසින් නිර්දේශ කරන ලද බෙහෙත් වට්ටෝරු ඉදිරිපත් කිරීම මගින් ද ඇතැම් පෙති වර්ග ලබා ගැනීම සිදු කරයි. ඊට අමතරව ඖෂධ

සැල් සමඟ සබඳතා ඇති පුද්ගලයින් මාර්ගයෙන් පෙති වර්ග ලබා ගෙන ඒවා මිතුරන් කණ්ඩායම් අතර හුවමාරු කර ගැනීම ද සිදු කරනු ලබයි.


**සිගරැට්, නීත්‍යානුකූල මද්‍යසාර සහ නීතිවිරෝධී මද්‍යසාර භාවිතය සම්බන්ධ තොරතුරු**

අධ්‍යයනය සඳහා තෝරා ගත් නියැදිය ආශ්‍රයෙන් සිගරැට්, නීත්‍යානුකූල මද්‍යසාර සහ නීතිවිරෝධී මද්‍යසාර භාවිතයේ ව්‍යාප්තිය සම්බන්ධයෙන් තොරතුරු ගවේෂණය කරන ලදි. එහිදී සිගරැට් භාවිතය සම්බන්ධ තත්ත්වය විමර්ශනය කිරීමේදී අධ්‍යයනයේ නියැදිය තුළ නියෝජනය වූ පුද්ගලයින්ගෙන් 930 (86%) ක් සිගරැට් භාවිතා කරන අතර ඔවුන්ගෙන් 865 දෙනෙක් දිනපතා සිගරැට් භාවිතා කරන පුද්ගලයින් බව අනාවරණය විය. අනෙක් 65 දෙනා දිනපතා නොවූවද කලාතුරකින් හෝ අවස්ථානුකූලව සිගරැට් භාවිතා කරනු ලබයි.

එමෙන්ම සමීක්ෂිත නියැදියෙන් නීත්‍යානුකූල මද්‍යසාර භාවිතා කරන පුද්ගලයින් සංඛ්‍යාව 617 (57%) ක් වන අතර ඔවුන් අතුරින් 165 (27%) ක් දිනපතා අරක්කු භාවිතා කරන පුද්ගලයින් විය. නීත්‍යානුකූල නොවන මද්‍යසාර භාවිතය සම්බන්ධ තත්ත්වය සැළකීමේදී නියැදිය තුළ නියෝජනය වූ පුද්ගලයින්ගෙන් 115 (11%) දෙනෙක් නීත්‍යානුකූල නොවන මද්‍යසාර භාවිතා කරන අතර ඔවුන්ගෙන් 29 දෙනෙක් දිනපතා භාවිතා කරන පුද්ගලයින්ය. එමෙන්ම අධ්‍යයනයට ලක් කරන ලද නියැදිය තුළ බියර් භාවිතා කරන පුද්ගලයින් 378 දෙනෙක් සිටි අතර ඒ අතුරින් 35%ක් දිනපතා බියර් භාවිතා කරන පුද්ගලයින් විය.

අධ්‍යයනයට ලක් කළ පුද්ගලයින් අතර රා වර්ග භාවිතයේ ව්‍යාප්තිය අවම මට්ටමක පැවතුණි. එනම් පුද්ගලයින් 44 (4%) ක් පමණක් රා වර්ග භාවිතා කරන අය වූ අතර එයින් පුද්ගලයින් 41 දෙනෙක් දිනපතා රා වර්ග භාවිතා කරනු ලබයි.

ප්‍රස්තාර අංක 16 - සිගරැට්, නීත්‍යානුකූල මද්‍යසාර සහ නීතිවිරෝධී මද්‍යසාර භාවිතයේ සංයුතිය




(මූලාශ්‍රය - පර්යේෂණ දත්ත 2016)

### පවුල් ව්‍යුහය තුළ මත්ද්‍රව්‍ය භාවිතයේ තත්ත්වය


අධ්‍යයනයේ නියැදිය තුළ නියෝජනය වූ පුද්ගලයින්ගේ පවුල් පසුබිම සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමේදී බොහෝ පවුල්වල එක් සාමාජිකයෙකුට වඩා වැඩි සංඛ්‍යාවක් මත්ද්‍රව්‍ය භාවිතා කරන බව හඳුනා ගත හැකි විය. අධ්‍යයනය සඳහා දත්තදායකයින් වූ පුද්ගලයින්ගෙන් 417 (39%) කගේ පවුල් තුළ එම පුද්ගලයාට අමතරව තවත් පුද්ගලයින් යම් මත්ද්‍රව්‍යයක් භාවිතා කරනු ලබයි. ඒ අනුව සාමාජිකයින් දෙදෙනෙක් මත්ද්‍රව්‍ය භාවිතා කරන පවුල් 223ක් පුද්ගලයින් තිදෙනෙක් මත්ද්‍රව්‍ය භාවිතා කරන පවුල් 138ක් සහ සාමාජිකයින් සිව් දෙනෙක් යම්කිසි මත්ද්‍රව්‍යයක් භාවිතා කරන පවුල් 34ක් අධ්‍යයනයේදී හඳුනා ගත හැකි විය.

එක් පවුල් ඒකකයක් තුළ මත්ද්‍රව්‍ය භාවිත අක්‍රමතාවයන්ගෙන් යුත් සාමාජිකයින් කිහිපදෙනෙක් ජීවත් වීම සමස්ත පවුල් ඒකකයේ පැවැත්ම කෙරෙහි විවිධ අංශ හරහා බලපෑම් කරන තත්ත්වයකි. ඒ හරහා ආර්ථික, සමාජයීය සහ සෞඛ්‍යමය වශයෙන් පවුලේ කෘත්‍යාත්මක පැවැත්ම ඍජුවම අවදානමට ලක්වේ.

### මත්ද්‍රව්‍ය භාවිතය සහ සෞඛ්‍යමය පැතිකඩ

මෙම අධ්‍යයනයේ දත්තදායකයින් ලෙස නියෝජනය වූ සියලු පුද්ගලයින් හෙරොයින්, ගංජා හෝ පෙති වර්ග වැනි මත්ද්‍රව්‍යයන් සහ අරක්කු, බියර්, නීත්‍යානුකූල මද්‍යසාර වැනි මත්පැන් වර්ග වලින් එකක් හෝ කිහිපයක් භාවිතා කරන පුද්ගලයින්ය. මත්ද්‍රව්‍ය භාවිතයේ දිගු කාලීන හෝ කෙටි කාලීන බලපෑම් මත අදාළ පුද්ගලයින් යම් සෞඛ්‍යමය අවදානමකින් පසුවන්නේද යන්න එනම්, මත්ද්‍රව්‍ය භාවිතයේ ප්‍රතිඵලයක් ලෙස ඔවුන් යම් රෝගී තත්ත්වයකින් පෙළෙන්නේද යන්න සම්බන්ධයෙන් මෙහිදී අවධානය යොමු කරන ලදි. ඒ අනුව සමස්ත දත්ත දායකයින්ගෙන් පුද්ගලයින් 121 (11%) දෙනෙක් මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් යම් රෝගී තත්ත්වයන්ගෙන් පසුවන බව අනාවරණය විය. ඒ අතර ක්ෂය රෝගය වැළඳුණු පුද්ගලයින් 34 දෙනෙක් සහ හෙපටයිටීස් සී තත්ත්වයෙන් පසුවන පුද්ගලයින් 7 දෙනෙක් හඳුනා ගත හැකිවිය. ඔවුන් දීර්ඝ කාලයක් මත්ද්‍රව්‍ය භාවිතා කිරීමේ ප්‍රතිඵලයක් ලෙස මෙවැනි රෝගී තත්ත්වයන්ට ගොදුරු වී ඇත. ඊට අමතරව පපුවේ මහන්සිය, හෘදය ආශ්‍රිත අක්‍රමතාවයන් සහ කැස්ස වැනි තත්ත්වයන්ගෙන් පෙළෙන පුද්ගලයින් 80 දෙනෙක් ද මේ අතර හඳුනා ගත හැකි විය. එම සියලු පුද්ගලයින්ගෙන් 74 දෙනෙක් අදාළ රෝගී තත්ත්වයන් සඳහා මේ වන විට ප්‍රතිකාර ලබා ගෙන හෝ දැනට ප්‍රතිකාර ලබා ගනිමින් සිටින පුද්ගලයින්ය.

ප්‍රස්තාර අංක 17 - රෝගී තත්ත්වයන්ගෙන් පෙළීම සම්බන්ධ ප්‍රවණතාව




(මූලාශ්‍රය - පර්යේෂණ දත්ත 2015)


මත්ද්‍රව්‍ය ඇබ්බැහිකාරීත්වය සඳහා ප්‍රතිකාර හා පුනරුත්ථාපන ක්‍රියාවලියට යොමු වීම පිළිබඳ තත්ත්වය විමසීමේදී අධ්‍යයනය සඳහා දායක වූ මත්ද්‍රව්‍ය භාවිතා කරන සමස්ත පුද්ගලයින්ගෙන් 26% (283) ක් කෙදිනක හෝ මත්ද්‍රව්‍ය ඇබ්බැහිකාරීත්වය සඳහා ප්‍රතිකාර හෝ පුනරුත්ථාපනය ලද පුද්ගලයින්ය. නමුත් 74%ක් වූ බහුතරයක් අධ්‍යයනය සිදු කරන අවස්ථාව වන විටත් එවැනි කිසිදු ප්‍රතිකාර හෝ පුනරුත්ථාපන වැඩසටහනකට සම්බන්ධ වී නොමැත. මත්ද්‍රව්‍ය ඇබ්බැහිකාරීත්වය සඳහා ප්‍රතිකාර ලබා ගෙන ඇති පුද්ගලයින්ගෙන් 8%ක් අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයට අයත් ප්‍රතිකාර මධ්‍යස්ථාන වලින් ද, 5%ක් රාජ්‍ය නොවන සංවිධාන වලට අයත් ප්‍රතිකාර මධ්‍යස්ථාන වලින් සහ 10%ක් පෞද්ගලිකව වෛද්‍යවරුන් මගින් හෝ වෙනත් පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන වලින් ප්‍රතිකාර ලබා ගෙන ඇත. නමුත් ඔවුන් සියලු දෙනා වරින්වර නැවත භාවිතයට යොමු වී ඇත.

**මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදි සම්බන්ධයෙන් වරදකරුවන් වීමේ ප්‍රවණතාව**

අධ්‍යයනය තුළ නියෝජනය වූ පුද්ගලයින්ගෙන් 517 (48%) ක් කෙදිනක හෝ මත්ද්‍රව්‍ය ආශ්‍රිත වරදක් සම්බන්ධයෙන් වරදකරුවකු වී නීතියේ රැහැනට හසුවූවන්ය. ඒ විවිධ මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදි සම්බන්ධයෙනි. ඔවුන් අතුරින් බොහෝ පුද්ගලයින් මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදි එකක් හෝ කිහිපයක් සම්බන්ධයෙන් වරදකරුවන් වූ පුද්ගලයින්ය. ඒ අතුරින් බහුතරයක් එනම් 484 (94%) දෙනෙක් මත්ද්‍රව්‍ය භාවිතා කිරීමේදී හෝ මත්ද්‍රව්‍ය ළඟ තබා ගැනීම සම්බන්ධයෙන් නීතියේ රැහැනට හසුවූවන්ය. ඊට අමතරව පුද්ගලයින් 277 (54%) දෙනෙක් මත්ද්‍රව්‍ය නිෂ්පාදනය සම්බන්ධයෙන් අත්අඩංගුවට පත්වූවන්ය. නියැදිය තුළ නියෝජනය වූ පුද්ගලයින්ගෙන් මත්ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීමේ වරද යටතේ පුද්ගලයින් 9 දෙනෙක් වරදකරුවන් වී ඇති අතර මත්ද්‍රව්‍ය අලෙවි කිරීම් සම්බන්ධ වරද යටතේ පුද්ගලයින් 31 දෙනෙක් වරදකරුවන් බවට පත්ව ඇත. අදාළ පුද්ගලයින්ගේ මත්ද්‍රව්‍ය භාවිතා

කිරීමේ ඉතිහාසය සම්බන්ධයෙන් ගැඹුරින් විමසීමේදී ඔවුන් සිය ජීවිත කාලය තුළ එකම වරද සම්බන්ධයෙන් කිහිපවරක් නීතියේ රැහැනට හසුවී දඬුවම් ලද පුද්ගලයින් බව තහවුරු විය.

ප්‍රස්තාර අංක 18 - මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදි සම්බන්ධයෙන් වරදකරුවන් වීමේ ප්‍රවණතාවය




(මූලාශ්‍රය - පර්යේෂණ දත්ත 2016)

එමෙන්ම මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදි සඳහා යොමු වූ පුද්ගලයින්ගේ ස්ත්‍රී පුරුෂ භාවය සහ ඔවුන් යොමු වන වරදේ ස්වභාවය අතර යම් සම්බන්ධතාවයක් පවතින්නේද යන්න සම්බන්ධයෙන් මෙහිදී අවධානය යොමු කරන ලදි. ඒ අනුව පැහැදිලි වූ කරුණක් නම්, අධ්‍යයනයේ දත්ත දායකයින් වූ මත්ද්‍රව්‍ය භාවිතා කරන කාන්තාවන් අතුරින් බහුතරයක් කෙදිනක හෝ මත්ද්‍රව්‍ය භාවිතය සහ ළඟ තබා ගැනීම සම්බන්ධ වැරදි යටතේ නීතියේ රැහැනට හසුවූ පුද්ගලයින්ය.

මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදි සඳහා යොමු වීමේ ස්ත්‍රී පුරුෂ සංයුතියට අදාළව එක් එක් පොලිස් බල ප්‍රදේශ මට්ටමින් ලබා ගත් අත්අඩංගුවට පත්වීම් සම්බන්ධ තොරතුරු විමසීමේදී පැහැදිලි වන කරුණක් නම්, මත්ද්‍රව්‍ය හෝ මත්පැන් භාවිතා නොකරන නමුත් මත්ද්‍රව්‍ය හෝ මත්පැන් අලෙවි කිරීමේ නියුක්ත වී නීතිය හමුවේ වරදකරුවන් බවට පත්වූ කාන්තාවන්ගේ ප්‍රතිශතය ඉහළ මට්ටමක පවතින බවයි. එනම් මත්ද්‍රව්‍ය හෝ මත්පැන් භාවිතයට වඩා ඒවා අලෙවි කිරීම සම්බන්ධයෙන් කාන්තාවන් තුළ ඉහළ යොමු වීමේ ප්‍රවණතාවක් පෙන්නුම් කරන බවයි.

**මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය සම්බන්ධ දත්ත දායකයින්ගේ මත විමසුම**

සසම්භාවී නොවන ලෙස නියැදිය සඳහා තෝරා ගත් පුද්ගලයින් දිවයිනේ විවිධ භූගෝලීය ප්‍රදේශ නියෝජනය කළ අතර ඔවුන්ගේ ප්‍රජා හා සමාජ විද්‍යාත්මක පසුබිම් ද විවිධ විය. ඊට අමතරව ඔවුන්ගේ මත්ද්‍රව්‍ය භාවිත රටාවන්ද පුළුල් පරාසයක් තුළ විහිදී පැවතිණි. මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන් යන අර්ථයෙන් ඔවුන් සමජාතීය කණ්ඩායමක් වුවද බොහෝ සංරචක අතින් ඔවුන් විෂමජාතීය


කණ්ඩායමක් ලෙස සැළකිය හැකිය. මෙවැනි විෂමජාතීය කණ්ඩායමක් තුළින් මෙම අධ්‍යයනයේදී මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය සම්බන්ධයෙන් ඔවුන්ගේ පෞද්ගලික මතයන්ද අධ්‍යයනයට ලක් කරන ලදී. මෙහිදී විශේෂයෙන් අවධානය යොමු කරන ලද ප්‍රධාන අංශ තුනක් විය.

- බහුලවම භාවිතා කරන මත්ද්‍රව්‍ය/මත්පැන් වර්ගයන් (Mostly Abused Drugs)
- අදාළ ප්‍රදේශ තුළ සමස්තයක් වශයෙන් පහසුවෙන් ලබා ගත හැකි මත්ද්‍රව්‍යයන් (easily accessible drugs)
- ප්‍රදේශ තුළ වඩාත් ගැටලුකාරී මත්ද්‍රව්‍යයන් (most problematic drugs)

**බහුලවම භාවිතා කරන මත්ද්‍රව්‍ය/මත්පැන් වර්ග (Mostly Abused Drugs) සම්බන්ධ ප්‍රතිචාර**

අධ්‍යයනයේ නියැදිය තුළ නියෝජනය වූ පුද්ගලයින්ගේ පෞද්ගලික අදහස් සහ අදාළ ප්‍රදේශ වල පවත්නා ප්‍රායෝගික වාතාවරණය සම්බන්ධයෙන් පවත්නා ඔවුන් සතු දැනුම අනුව පුද්ගලයින් විසින් බහුලවම භාවිතා කරන මත්ද්‍රව්‍ය/ මත්පැන් වර්ගය කුමක්ද යන්න සම්බන්ධයෙන් අදහස් විමසන ලදි. එහිදී ඔවුන් එක් මත්ද්‍රව්‍ය/ මත්පැන් වර්ගයක් හෝ ඊට වඩා වැඩි ප්‍රමාණයක නම් සඳහන් කරන ලදි. ඒ අනුව නියැදිය තුළ නියෝජනය වූ පුද්ගලයින්ගෙන් 85%ක් නීත්‍යානුකූල මද්‍යසාර (අරක්කු) බහුලවම භාවිතා කරන මත්පැන් වර්ගය ලෙස ප්‍රතිචාර දැක්වූ අතර නියැදිය තුළ නියෝජනය වූ පුද්ගලයින්ගෙන් 88%ක් සිගරට් බහුලවම පුද්ගලයින් අතර භාවිතා වන මත්ද්‍රව්‍ය ලෙස ප්‍රතිචාර දක්වා ඇත. අන්තරායකර ඖෂධ ගණයට ගැනෙන මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් මෙම අදහස් විමසීමේදී නියැදියෙන් 89%ක පිරිසක් ගංජා බහුලවම භාවිතා වන මත්ද්‍රව්‍ය ලෙස ප්‍රතිචාර දක්වා ඇති අතර නියැදියෙන් 66%ක් හෙරොයින් බහුලවම භාවිතා වන මත්ද්‍රව්‍ය ලෙස ප්‍රතිචාර දක්වා ඇත. ඊට අමතරව නියැදියේ නියෝජනය වූ පුද්ගලයින්ගෙන් 30%ක් නීත්‍යානුකූල නොවන මද්‍යසාර එනම්, කසිප්පු බහුලවම භාවිතා වන මත්පැන් වර්ගය ලෙස ප්‍රතිචාර දක්වා ඇත. මෙම අදහස් විමසුම සහ ඒවාට ලැබුණු ප්‍රතිචාර විමර්ශනය කිරීමේදී පැහැදිලි වන කරුණක් නම්, අන්තරායකර ඖෂධ අතුරින් හෙරොයින් වලට සාපේක්ෂව ගංජා බහුලවම භාවිතා වන මත්ද්‍රව්‍ය බවත්, ඊට අමතරව සිගරට් සහ නීත්‍යානුකූල මද්‍යසාර පුද්ගලයින් අතර බහුලවම භාවිතා වන බවයි.

ප්‍රස්තාර අංක 19 - බහුලවම භාවිතා කරන මත්ද්‍රව්‍ය/මත්පැන් වර්ග




(මූලාශ්‍රය - පර්යේෂණ දත්ත 2016)


**වඩාත් ගැටලුකාරී මත්ද්‍රව්‍ය හා මත්පැන් (most problematic drugs) සම්බන්ධ ප්‍රතිචාර**

මත්ද්‍රව්‍ය දුර්භාවිතය හුදෙක් අදාළ පුද්ගලයින්ගේ සමාජ, ආර්ථික හා සෞඛ්‍යමය යන අංශයන් කෙරෙහි බලපෑම් කරන තත්ත්වයක් පමණක් නොව ඒ හරහා සමාජ සන්දර්භය තුළ නිර්මාණය වන ගැටලුකාරී තත්ත්ව රාශියක් ඇත. දෛනිකව වාර්තා වන අත්අඩංගුවට ගැනීම් සහ නඩු සංඛ්‍යාව සැළකිල්ලට ගැනීමේදී බොහෝ සිවිල් ආරවුල් සහ අනතුරු සඳහා මූලික වස්තු විෂය බවට පත්වන්නේ මත්ද්‍රව්‍ය භාවිතයයි. මෙවැනි පසුබිමක් තුළ අධ්‍යයනයේ දත්ත දායකයින්ගෙන් මත්ද්‍රව්‍ය දුර්භාවිතය හා ඒ හරහා මතුවන ගැටලුකාරී තත්ත්ව සම්බන්ධයෙන් ප්‍රතිචාර විමසන ලද අතර එහිදී පුළුල් පරාසයක විහිද යන ප්‍රතිචාර මේ සම්බන්ධයෙන් මතුවී ඇත.

අධ්‍යයනයේ නියැදිය තුළ නියෝජනය වූ දත්ත දායකයින්ගේ පූර්ව අත්දැකීම් අනුව කෙදිනක හෝ යම් මත්ද්‍රව්‍යයක් හේතුවෙන් ඔවුන්ගේ ප්‍රදේශයන්ට හෝ මානව සමාජ ජීවිතවලට යම් ගැටලුකාරී තත්ත්වයක් උද්ගත වී තිබේද යන ප්‍රස්තුතය සඳහා මෙහිදී පුද්ගලයින්ගෙන් ප්‍රතිචාර ලබා ගන්නා ලදි. එහිදී සමස්ත පුද්ගලයින්ගෙන් 59%ක් මත්ද්‍රව්‍ය හේතුවෙන් කෙදිනක හෝ යම් කිසි ගැටලුකාරී තත්ත්වයක් උද්ගතවීම් සම්බන්ධ අත්දැකීම් ඇති අය බව අනාවරණය වූ අතර එයින් 41%ක් එවැනි සැළකිය යුතු මට්ටමේ ගැටලුකාරී තත්ත්වයක් උද්ගතවීම් සම්බන්ධ අත්දැකීම් නොමැති අය බව තහවුරු විය. මේ සම්බන්ධව තවදුරටත් දත්ත දායකයින්ගේ ප්‍රතිචාර විමසීමේදී ඔවුන් ජීවත් වන සමාජ, ආර්ථික පරිසරයන්ට සහ එක් එක් ප්‍රදේශයන්ට සාපේක්ෂව සැළකීමේදී එවැනි ගැටලුකාරී තත්ත්වයන් උද්ගත වීම කෙරෙහි බලපාන ලද මත්ද්‍රව්‍ය හෝ මත්පැන් වර්ගයන් සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලදි. ඒ සම්බන්ධයෙන් අදාළ පුද්ගලයින් දක්වන ලද ප්‍රතිචාරවලට අනුව යම් ගැටලුකාරී තත්ත්වයක් උද්ගත වීම සඳහා බලපාන ලද මත්ද්‍රව්‍ය හෝ වඩාත්ම ගැටලුකාරී මත්ද්‍රව්‍ය හෝ මත්පැන් වර්ගය ලෙස නියැදියේ පුද්ගලයින්ගෙන් 52%ක් නීත්‍යානුකූල මද්‍යසාර දක්වා ඇත. ඊට

අමතරව නියැදියේ නියෝජනය වූ පුද්ගලයින්ගෙන් 49%ක් ගංජා වඩාත් ගැටලුකාරී මත්ද්‍රව්‍ය ලෙසත්, 45%ක් හෙරොයින් වඩාත් ගැටලුකාරී මත්ද්‍රව්‍ය ලෙසත් ප්‍රතිචාර දක්වා ඇත. බොහෝ අවස්ථාවල ගැටලුකාරී මත්ද්‍රව්‍ය සම්බන්ධව විමසීමේදී මත්ද්‍රව්‍ය හෝ මත්පැන් වර්ග එකක් හෝ කිහිපයක නම් ප්‍රතිචාර වශයෙන් ඉදිරිපත් කර ඇත. ඒ අනුව 37%ක් නීත්‍යානුකූල නොවන මද්‍යසාර එනම්, කසිප්පු වඩාත් ගැටලුකාරී මත්පැන් වර්ගය ලෙස ප්‍රතිචාර දක්වා ඇත.

ප්‍රස්තාර අංක 20 - වඩාත් ගැටලුකාරී මත්ද්‍රව්‍ය හා මත්පැන් වර්ග




(මූලාශ්‍රය - පර්යේෂණ දත්ත 2016)

වඩාත් ගැටලුකාරී මත්ද්‍රව්‍ය හෝ මත්පැන් වර්ගය සම්බන්ධ දත්ත දායකයින්ගේ ප්‍රතිචාර විමසීමේදී පාසල් සිසුන් අතර මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තියක් පවතින්නේද යන්න සම්බන්ධයෙන් තොරතුරු සොයා බැලීම කෙරෙහි අවධානය යොමු කරන ලදි. එහිදී අදාළ පුද්ගලයින් නියෝජනය කරන ප්‍රදේශ වල මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය සම්බන්ධයෙන් ඔවුන් සතු අවබෝධය සහ තොරතුරු වලට අනුව අදාළ ප්‍රදේශ තුළ පාසල් සිසුන් මත්ද්‍රව්‍ය භාවිතය සඳහා යොමු වූ අවස්ථා පවතින්නේද යන්න සම්බන්ධයෙන් ප්‍රතිචාර විමසන ලද අතර එහිදී සමස්ත නියැදියෙන් 55% (593) ක් එම තත්ත්වය අනුමත කර ඇත. එනම් අදාළ ප්‍රදේශ වල පාසල් සිසුන් අතර යම් ආකාරයක මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වීමේ ප්‍රවණතාවක් පවතින බවට තොරතුරු වාර්තා වී ඇති බවයි. එවැනි තත්ත්වයන් සම්බන්ධයෙන් ප්‍රතිචාර දක්වන ලද පුද්ගලයින්ගෙන් ඒ පිළිබඳව තවදුරටත් විමසන ලදි. එනම් පාසල් සිසුන් අතර මත්ද්‍රව්‍ය භාවිතයේ යම් ප්‍රවණතාවක් ඇති බවට ඔවුන් පෞද්ගලිකව ප්‍රතිචාර දක්වන්නේ නම් එසේ ව්‍යාප්තව ඇත්තේ කවර මත්ද්‍රව්‍ය හෝ මත්පැන් වර්ගයද යන්න සම්බන්ධයෙනි.

මෙ පිළිබඳ අවධානය යොමු කිරීමේදී සිගරට්, දුම්කුඩු, මද්‍යසාර, මදනමෝදකය, සහ මාවා නමැති පුවක් විශේෂය යන ද්‍රව්‍යයන් භාවිතා කිරීම් පිළිබඳ සිද්ධීන් සම්බන්ධයෙන් ඔවුන් සාක්ෂි දරයි. මූලික තොරතුරු සපයන්නන් සමග කරනලද සම්මුඛ සාකච්ඡා තුළින්ද හෙළිවූ ආකාරයට පැහැදිළිවූයේ

ඇතැම් ප්‍රදේශ වල පාසල් සිසුන් අතර යම් මත්කාරක ද්‍රව්‍ය භාවිතයට යොමුවීමේ ප්‍රවණතාවක් පවතින බවයි.

**පහසුවෙන්ම ලබාගත හැකි මත්ද්‍රව්‍ය වර්ග (Easily accessible drugs) සම්බන්ධ ප්‍රතිචාර**

මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් පවත්නා ඉල්ලුම සහ සැපයුම අතර ඇතිවන අසමබරතාව තුළදී මත්ද්‍රව්‍ය ලබා ගැනීමට ඇති හැකියාවේ (drug availability) විෂමතාවන් මතු වෙයි. නීතිය ක්‍රියාත්මක කිරීම හරහා මත්ද්‍රව්‍ය සඳහා වන සැපයුම අඩාල කිරීම තුළින් මිලදී ගැනීමට ඇති හැකියාව අඩු වෙයි. එමෙන්ම සැපයුම අඩාල වීමට සාපේක්ෂව ඒ සඳහා පවත්නා ඉල්ලුම අවම නොවීම තුළ මෙම මිලදී ගැනීමට ඇති හැකියාව කෙරෙහි සෘජුවම බලපෑම් ඇති වෙයි. එය එක් එක් මත්ද්‍රව්‍ය හා මත්පැන් වර්ගයන් අනුව මෙන්ම ප්‍රදේශ අනුව ද වෙනස්වීමට ලක්වෙයි. විවිධ ප්‍රදේශ ආශ්‍රයෙන් අධ්‍යයනයේ නියැදියට ඇතුළත් කර ගන්නා ලද දත්ත දායකයින්ගෙන් සමස්තයක් ලෙස එක් එක් මත්ද්‍රව්‍ය හෝ මත්පැන් වර්ගය සඳහා ඇති මිලදී ගැනීමේ හැකියාවේ විවිධ මට්ටම් පිළිබඳ පරිමාණයක් ඇසුරින් ප්‍රතිචාර ලබා ගන්නා ලදි. එහිදී එක් එක් මත්ද්‍රව්‍ය වර්ගය අනුව වෙනස් වූ ප්‍රතිචාරයන් දක්වා ඇත.

එම ප්‍රතිචාර ලබා ගැනීමේදී එක් එක් මත්ද්‍රව්‍ය හෝ මත්පැන් වර්ගය අනුව පහත පරිමාණය භාවිතා කරන ලදි.

1) අදාළ මත්ද්‍රව්‍ය/ මත්පැන් වර්ගය මිලදී ගැනීමට ඇති හැකියාව ඉතා පහසුයි.

2) අදාළ මත්ද්‍රව්‍ය/ මත්පැන් වර්ගය මිලදී ගැනීමට ඇති හැකියාව තරමක් පහසුයි.

3) අදාළ මත්ද්‍රව්‍ය/ මත්පැන් වර්ගය මිලදී ගැනීමට ඇති හැකියාව සාමාන්‍යයයි.


4) අදාළ මත්ද්‍රව්‍ය/ මත්පැන් වර්ගය මිලදී ගැනීමට ඇති හැකියාව අපහසුයි.

ඉහත පරිමාණයට අනුව නීත්‍යානුකූල මද්‍යසාර සහ සිගරට් සම්බන්ධයෙන් මිලදී ගැනීමට ඇති හැකියාවේ ඉහළ අගයක් පෙන්නුම් කරන ලදි. එනම් නියැදියේ පුද්ගලයින්ගෙන් 67%කට මද්‍යසාර මිලදී ගැනීමට ඇති හැකියාව ඉතා පහසු බවත්, 20%ක් තරමක් පහසු බවත් දක්වා ඇත.

සිගරට් සම්බන්ධයෙන් සැලකූ විට, නියැදිය තුළ නියෝජනය වූ පුද්ගලයින්ගෙන් 80%ක ප්‍රතිශතයක් සිගරට් මිලදී ගැනීමට ඇති හැකියාව ඉතා ඉහළ බව දක්වා ඇත. මෙම මත්ද්‍රව්‍ය හා මත්පැන් වර්ග පාලනයකට යටත් කළ මත්ද්‍රව්‍ය වන අතර ඒවා අලෙවිය සම්බන්ධයෙන් එතරම් ගැටලුකාරී තත්ත්වයක් නොමැති නිසා ඒ සම්බන්ධ මිලදී ගැනීමේ හැකියාව ඉතා පහසු මට්ටමක පවතී.

ගංජා, හෙරොයින් සහ පෙති වර්ග සම්බන්ධ තත්ත්වය විමර්ශනය කිරීමේදී මීට වඩා වෙනස් වූ තත්ත්වයක් දැකගත හැකිය. එනම් හෙරොයින් වලට සාපේක්ෂව ගංජා වල මිලදී ගැනීමේ හැකියාව තරමක් ඉහළ මට්ටමක පවතින බව පැහැදිලි වේ. නියැදිය තුළ නියෝජනය වූ පුද්ගලයින්ගෙන් 11%ක් ගංජා මිලදී ගැනීමට ඇති හැකියාව ඉතා පහසු බව දක්වා ඇති අතර 36%ක් එය තරමක් පහසු බව දක්වා ඇත. ඒ අතුරින් 19%ක ප්‍රතිශතයක් පමණක් ගංජා මිලදී ගැනීමට ඇති හැකියාව අපහසු මට්ටමක පවතින බව දක්වා ඇත.

ප්‍රස්තාර අංක 21 - පහසුවෙන්ම ලබාගත හැකි මත්ද්‍රව්‍ය වර්ග




(මූලාශ්‍රය - පර්යේෂණ දත්ත 2016)

හෙරොයින් පිළිබඳව උක්ත පරිමාණය තුළ ප්‍රතිචාරයන් ගොනු කිරීමේදී සමස්ත අධ්‍යයනයට ලක් කළ පුද්ගලයින්ගෙන් 5%ක් පමණක් හෙරොයින් මිලදී ගැනීමට ඇති හැකියාව ඉතා පහසු බව දක්වා ඇත. තවද 10%ක ප්‍රතිශතයක් එය තරමක් පහසු බවටද 53%ක ඉහළ ප්‍රතිශතයක් හෙරොයින් මිලදී ගැනීමට ඇති හැකියාව ඉතා පහළ මට්ටමක පවතින බවට ප්‍රතිචාරයන් දක්වා ඇත. පෙති වර්ග භාවිතය සහ ඒ ආශ්‍රිත තත්ත්වය සම්බන්ධයෙන් ඉහත පරිමාණයට අනුව සමස්ත නියැදියෙන් 3%ක ඉතා සුළු ප්‍රතිශතයක් පෙති වර්ග මිලදී ගැනීමට ඇති හැකියාව අපහසු මට්ටමක පවතින බවට වූ අදහස තුළයි. මේ අනුව ඉහත මත්ද්‍රව්‍ය වර්ග මිලදී ගැනීමට ඇති හැකියාව ඒවා සම්බන්ධ වාර්තා වන අත්අඩංගුවට ගැනීම් වලට සහ ව්‍යාප්තියට සමානුපාතික වෙයි. එනම් 2015 වර්ෂයේ මත්ද්‍රව්‍ය ආශ්‍රිත අත්අඩංගුවට ගැනීම් වලට අදාළ සංඛ්‍යාලේඛන අනුව ගංජා සම්බන්ධයෙන් වැඩිම පුද්ගල සංඛ්‍යාවක් වාර්තා වී ඇත. ඊට සාපේක්ෂව හෙරොයින් සඳහා වූ අත්අඩංගුවට ගැනීම් වල අඩු අගයක් පෙන්නුම් කරයි. මත්ද්‍රව්‍ය මිලදී ගැනීමේ හැකියාව ඉහළ යන විට ඊට සාපේක්ෂව භාවිතය සහ ඒ ආශ්‍රිත වෙනත් වැරදි සඳහා යොමු වීමේ ප්‍රවණතාවයද ඉහළ යයි.

# මත්ද්‍රව්‍ය භාවිතය ආශ්‍රිත නූතන ප්‍රවණතා

මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය සහ නූතන ප්‍රවණතා සම්බන්ධයෙන් සිදු කරන ලද මෙම අධ්‍යයනය තුළ මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය සහ ඒ හා බැඳුණු රටාආදිය පිළිබඳව අධ්‍යයනය කළ අතර ඊට අමතරව මත්ද්‍රව්‍ය දුර්භාවිතය ආශ්‍රිත කාලීන ප්‍රවණතා සම්බන්ධයෙන් ද අවධානය යොමු කරන ලදි. එසේ නූතන ප්‍රවණතා පිළිබඳ අධ්‍යයනය කිරීමේදී දිවයිනේ පොලිස් බල ප්‍රදේශ මට්ටමින් මත්ද්‍රව්‍ය දුර්භාවිත වාතාවරණය පිළිබඳ මූලික තොරතුරු අධ්‍යයනය කිරීම සිදු කරන ලදි. මූලික තොරතුරු සපයන්නන් සමග කරනලද සම්මුඛ සාකච්ඡා මගින් නූතන ප්‍රවණතා සම්බන්ධයෙන් තොරතුරු අධ්‍යයනය කරන ලදි. මත්ද්‍රව්‍ය දුර්භාවිතය ආශ්‍රිත නූතන ප්‍රවණතා පිළිබඳ අධ්‍යයනය කිරීමේදී පහත සඳහන් නිර්නායකයන් පදනම් කරගෙන ඇත.

1. අදාළ ප්‍රදේශ  තුළ පසුගිය මාස 03 හි හෙරොයින්, ගංජා සහ නීතිවිරෝධී මද්‍යසාර සම්බන්ධ අත්අඩංගුවට ගැනීම් පිළිබඳ තත්ත්වය
2. අදාළ ප්‍රදේශයන් වල පෙති වර්ග/ වට්ටෝරුගත ඖෂධ වර්ග අනිසි භාවිතය පිළිබඳ වාර්තාවූ සිද්ධීන්
3. පාසල් ළමුන් අතර යම් මත්ද්‍රව්‍යයක් ව්‍යාප්ත වීම හා සම්බන්ධ වාර්තා වූ සිද්ධීන්
4. මත්ද්‍රව්‍ය දුර්භාවිතය සම්බන්ධ සිද්ධීන් වල ස්ත්‍රී පුරුෂ නියෝජනය


**අදාළ ප්‍රදේශ  තුළ අනුගාමී මාස 03 ක හෙරොයින්, ගංජා සහ නීතිවිරෝධී මද්‍යසාර සම්බන්ධ අත්අඩංගුවට ගැනීම් පිළිබඳ තත්ත්වය**

අධ්‍යයනය සඳහා ක්ෂේත්‍රය වශයෙන් තෝරාගත් දිවයිනේ පොලිස් බල ප්‍රදේශ  28ක් ආශ්‍රයෙන් මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය සහ නූතන ප්‍රවණතා සම්බන්ධයෙන් අධ්‍යයනය කරන ලද අතර එහිදී අදාළ පොලිස් කොට්ඨාශ වල අනුගාමී මාස 03 කාල සීමාවක් තුළ හෙරොයින්, ගංජා සහ නීති විරෝධී මද්‍යසාර සම්බන්ධයෙන් අත්අඩංගුවට ගැනීම් වල තත්ත්වය එක් නිර්නායකයක් ලෙස භාවිතා කරන ලදි. ඒ අනුව අදාළ ප්‍රදේශ  වල උක්ත මත්ද්‍රව්‍ය හා මත්පැන් සම්බන්ධ අත්අඩංගුවට ගැනීම් පිළිබඳ සංඛ්‍යාත්මක දත්ත ලබාගත් අතර ඊට අමතරව නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් සමග මූලික සම්මුඛ සාකච්ඡා මගින්ද අදාළ ප්‍රදේශ  වල මත්ද්‍රව්‍ය ව්‍යාප්තිය පිළිබඳව දත්ත ලබා ගන්නා ලදි. අදාළ ප්‍රදේශ  වල හෙරොයින් ,ගංජා සහ නීති විරෝධී මද්‍යසාර සම්බන්ධ අත්අඩංගුවට ගැනීම් වල ප්‍රමාණය අනුව මත්ද්‍රව්‍ය ව්‍යාප්තිය සම්බන්ධයෙන් පහත නිගමනයන්ට එළඹීමට හැකියාවක් ලැබුණි. ඉහත මත්ද්‍රව්‍ය සම්බන්ධ අත්අඩංගුවට ගැනීම් වල සංඛ්‍යාත්මක දත්ත මත ව්‍යාප්තිය මිනුම් කිරීමේදී ද්විතීයික මූලාශ්‍රයක් ලෙස මත්ද්‍රව්‍ය දුර්භාවිත තොරතුරු අත්පොත 2016 භාවිතා කරන ලදි.

බස්නාහිර පළාතට අයත් කොළඹ, ගම්පහ සහ කළුතර යන දිස්ත්‍රික්කයන් පිළිබඳව සැලකීමේදී කොළඹ දිස්ත්‍රික්කයට අයත් පොලිස් කොට්ඨාශයන් පහ තුළම අදාළ කාල සීමාව තුළ ඉහළ ව්‍යාප්තියක් පෙන්නුම් කර ඇත්තේ ගංජා සම්බන්ධයෙනි. නීති විරෝධී මද්‍යසාර සම්බන්ධයෙන් පහළ ව්‍යාප්තියක් පෙන්නුම් කර ඇත. ගම්පහ දිස්ත්‍රික්කයට අයත් ගම්පහ, කැළණිය සහ මීගමුව යන

පොලිස් කොට්ඨාශයන් වල අදාළ කාල සීමාව තුළ නීති විරෝධී මද්‍යසාර වල ඉහළ ව්‍යාප්තියක් පෙන්නුම් කර ඇති අතර හෙරොයින් සම්බන්ධයෙන් පහළ ව්‍යාප්තියක් පෙන්නුම් කර ඇත. කළුතර දිස්ත්‍රික්කයට අයත් කළුතර සහ පානදුර යන පොලිස් කොට්ඨාශයන් වල ව්‍යාප්තිය විමසීමේදී ද අදාළ කාල සීමාව තුළ නීති විරෝධී මද්‍යසාර සම්බන්ධයෙන් ඉහළ ව්‍යාප්තියක් සහ හෙරොයින් සම්න්ධයෙන් පහළ ව්‍යාප්තියක් පෙන්නුම් කර ඇත.

ප්‍රස්තාර අංක 22 - අනුගාමී මාස 03 ක අත්අඩංගුවට ගැනීම් පිළිබඳ දත්ත අනුව බස්නාහිර පළාතේ එක් එක් පොලිස් කොට්ඨාශයන් වල මත්ද්‍රව්‍ය ව්‍යාප්තිය





(මූලාශ්‍රය - පර්යේෂණ දත්ත 2016)

ඒ අනුව බස්නාහිර පළාතට අයත් කොළඹ දිස්ත්‍රික්කයේ අදාළ කාල සීමාව තුළ අනෙක් මත්ද්‍රව්‍ය වලට සාපේක්ෂව නීති විරෝධී මද්‍යසාර වල පහළ ව්‍යාප්තියක් පෙන්නුම් කර ඇති අතර ගම්පහ සහ කළුතර යන දිස්ත්‍රික්කයන් වල ඊට සාපේක්ෂව නීතිවිරෝධී මද්‍යසාර වල ඉහළ ව්‍යාප්තියක් පෙන්නුම් කර ඇත.

අනෙකුත් පළාත් වල තත්ත්වය විමර්ශනය කිරීමේදී දකුණු පළාත තුළ ගාල්ල සහ ඇල්පිටිය යන පොලිස් කොට්ඨාශයන් වල අදාළ කාල සීමාව තුළ අනෙකුත් මත්ද්‍රව්‍ය වලට සාපේක්ෂව නීතිවිරෝධී මද්‍යසාර වල ඉහළ ව්‍යාප්තියක් පෙන්නුම් කර ඇති අතර තංගල්ල , මාතර සහ හම්බන්තොට යන පොලිස් කොට්ඨාශයන් වල ගංජා සම්බන්ධයෙන් ඉහළ ව්‍යාප්තියක් පෙන්නුම් කර ඇත. ඊට අමතරව මන්නාරම, මාතලේ, මහනුවර සහ වව්නියා යන පොලිස් කොට්ඨාශයන් වල අදාළ කාල සීමාව තුළ අනෙක් මත්ද්‍රව්‍ය වලට සාපේක්ෂව ගංජා සම්බන්ධයෙන් ඉහළ ව්‍යාප්තියක් පෙන්නුම් කර ඇත.

ප්‍රස්තාර අංක 23 - අනුගාමී මාස 03 ක අත්අඩංගුවට ගැනීම් පිළිබඳ දත්ත අනුව එක් එක් පොලිස් කොට්ඨාශයන් වල මත්ද්‍රව්‍ය ව්‍යාප්තිය




(මූලාශ්‍රය - පර්යේෂණ දත්ත 2016)

**වෛද්‍යමය අරමුණු සඳහා නිර්දේශිත ඖෂධ වර්ග අනිසි භාවිතය සම්බන්ධ ප්‍රවණතා**

අධ්‍යයනයේ දත්ත දායකයින්ගේ මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ ප්‍රවණතා සම්බන්ධයෙන් සැළකීමේදී අදාළ දත්ත දායකයින්ගෙන් ලද තොරතුරු සහ මූලික තොරතුරු සපයන්නන් සමඟ පැවැත්වූ සම්මුඛ සාකච්ඡා මඟින් ලද තොරතුරු අනුව ශ්‍රී ලංකාවේ වට්ටෝරුගත ඖෂධ අනිසි භාවිතා කිරීමේ යම් ප්‍රවණතාවක් පවතින බව හඳුනාගත හැකිය. විශේෂයෙන් හෙරොයින් වැනි මාදක ගණයේ මත්කාරක ද්‍රව්‍ය භාවිතයට යොමු වූ පුද්ගලයින් එයට අමතර හෝ විකල්පයන් ලෙස මෙම ඖෂධ අනිසි ලෙස භාවිතා කරනු ලබයි. අධ්‍යයනයෙන් ලද දත්ත වලට අනුව පහත සඳහන් ඖෂධ වර්ග වල අනිසි භාවිතයේ ප්‍රවණතාවක් ඇතැම් ප්‍රදේශ වල පවතින බව අනාවරණය විය.

- Morphine
- Diazepam
- Perryton
- Flunitrazepam/ Rohypnol
- Pregaballin
- Ativan
- Artane (Trihexiphenidyl)
- Clonazepam
- Rexulti (Brexpiprazol)
- Corex D

ඉහත ද්‍රව්‍යයන් සම්බන්ධයෙන් අධ්‍යයනයට ලක් කළ ප්‍රදේශ වල අනිසි භාවිතා කිරීමේ අවස්ථාවන් වාර්තා වී ඇති බව නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් සමඟ කරන ලද සම්මුඛ සාකච්ඡා තුළින් තහවුරු විය. මෙවැනි ඖෂධ වර්ග භාවිතය සඳහා බොහෝ විට යොමු වී සිටින්නේ හෙරොයින් වැනි මාදක ගණයේ ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහි වූ පුද්ගලයින් බවයි. වෛද්‍යවරයෙකුගේ වෛද්‍ය නිර්දේශයක් මත පමණක් නිකුත් කළ යුතු මෙවැනි ඖෂධ වර්ග ලබා ගැනීමේදී අදාළ පුද්ගලයින් ප්‍රධාන වශයෙන් භාවිතා කරන ක්‍රම දෙකක් ඇත. එනම් රෝගියෙකු සඳහා වෛද්‍යවරයෙකු විසින් නිර්දේශ කරන ලද ඖෂධ වට්ටෝරු අයුතු ලෙස භාවිතා කරමින් ඖෂධ සැල් වලින් ඖෂධ ලබා ගනියි. අනෙක් ක්‍රමය නම් සමහර ඖෂධ සැල් හිමියන් සමග පෞද්ගලිකව ගොඩනගා ගත් සම්බන්ධතාවයන් මත වෛද්‍ය නිර්දේශයකින් තොරව අදාළ ඖෂධ ලබා ගනියි. එහිදී එක් පුද්ගලයෙකු විසින් එසේ ලබා ගන්නා ඖෂධ ඔහුගේ මිතුරු කණ්ඩායම සමඟ හුවමාරු කර ගැනීම ද ඇතැම් විට සිදු කරනු ලබයි.

ඖෂධ වර්ග අනිසි භාවිතය සම්බන්ධව පවත්නා තවත් ප්‍රවණතාවක් නම් කොළඹ ඇතුළු නාගරික කලාපවල ඇතැම් තරුණ කණ්ඩායම් රාත්‍රී සමාජ ශාලා සහ වෙරළ සාදයන් ආශ්‍රිත අවස්ථාවන්ට සහභාගී වීමේදී මෙවැනි වෛද්‍යමය අරමුණු සඳහා භාවිතා කරන ඖෂධ වර්ග අනිසි ලෙස භාවිතා කිරීමට යොමු වී ඇත. ඔවුන් ඒ සඳහා භාවිතා කරන පොදු නාමය " Pharmacy Item" හෝ "Taba" යන්නයි.

නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන්ගේ අදහස් වලට අනුව ඖෂධ අනිසි භාවිතය සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කිරීමේදී ඔවුන් මුහුණපාන ප්‍රධාන ගැටලු කිහිපයක් හඳුනා ගත හැකිය.

01. වෛද්‍යමය නිර්දේශයන් මත නිකුත් කරනු ලබන ඖෂධ වර්ග සහ අනෙකුත් ඖෂධ වර්ග සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් සතු තාක්ෂණික සහ නෛතික දැනුම ප්‍රමාණවත් නොවීම.

එනම් ඖෂධ අනිසි ලෙස භාවිතා කරන පුද්ගලයින් ඔවුන්ගේ ඇබ්බැහිකාරීත්වයේ මට්ටම අනුව විවිධ ඖෂධ වර්ග අනිසි ලෙස භාවිතයට යොමු වෙයි. ඇතැම් ඖෂධ වර්ග ඔවුන් වෛද්‍යමය නිර්දේශයන් භාවිතා කරමින් ව්‍යාජ ලෙස මිලදී ගන්නා අතර ඇතැම් අවස්ථාවල ඖෂධ සැල් මඟින් අයථා ලෙස මෙවැනි ඖෂධ නිකුත් කරනු ලබයි. එවැනි අවස්ථාවල අදාළ ඖෂධ නිකුත් කළ යුතු ආකාරය, ඒවා අයත් වන කාණ්ඩයන් සහ එහි නෛතික පසුබිම පිළිබඳ නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන්ට පුළුල් විශේෂඥ දැනුමක් නොමැති බව මේ සම්බන්ධයෙන් ඔවුන් දක්වන ලද අදහස් තුළින් අවධාරණය විය. එමෙන්ම ඖෂධ අනිසි භාවිතය අනෙකුත් මත්ද්‍රව්‍ය භාවිතයටත් වඩා සමාජයේ ප්‍රකටව දක්නට නොහැකි ප්‍රපංචයකි. එම ඖෂධ වර්ග භාවිතා කරන ආකාරය, ලබා ගන්නා ආකාරය හා ළඟ තබා ගැනීම යන්න අනෙකුත් මත්ද්‍රව්‍යයන් හා සැසඳීමේදී අප්‍රකට කරුණකි.

02. වෛද්‍යමය අරමුණු සඳහා භාවිතා කරන ඖෂධ අවභාවිතා කිරීමේ සිද්ධීන් සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කිරීමේදී නෛතික කාර්යය පටිපාටිය තුළ මතුවන ප්‍රායෝගික දුෂ්කරතාවයන්.

ඖෂධ අනිසි භාවිතා කිරීම් වලට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය තුළ ආහාර සහ ඖෂධ පරීක්ෂකවරයෙකුගේ සහාය ලබා ගැනීම නමැති කාරණයේදී මෙම ප්‍රායෝගික ගැටලුව මතු වෙයි. එනම් අදාළ ආහාර සහ ඖෂධ පරීක්ෂක නිලධාරීන් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල මට්ටමින් අනියුක්ත කර ඇති අතර ඖෂධ අනිසි භාවිතා කිරීම් සම්බන්ධ සිද්ධියක් පිළිබඳව අදාළ තොරතුර ලද අවස්ථාවේම වැටලීම් ක්‍රියාත්මක කිරීම තරමක් දුෂ්කර කරුණක් බවට පත්වෙයි. එනම් වැටලීම ක්‍රියාත්මක කිරීමට පෙර අදාළ නිලධාරියාගේ සහාය ලබා ගැනීමට සිදු වීමයි. මෙම තත්ත්වය තුළ අදාළ වැටලීම හෝ නීතිය ක්‍රියාත්මක කිරීම සාර්ථකව ඉටු කිරීමට ඇති අවස්ථාව අහිමිවී යන තත්ත්වයක් ඇති බවට ඔවුන් සිය ප්‍රායෝගික උදහරණ තුළින් අවධාරණය කරන ලදි. එමෙන්ම මෙම යාන්ත්‍රණයේ මීට වඩා නම්‍යශීලි සහ පහසු ප්‍රවේශයක අවශ්‍යතාවයද ඔවුන් විසින් අවධාරණය කරන ලදි.

ඖෂධ අවභාවිතා කරන පුද්ගලයින් බොහෝවිට තමන් භාවිතා කරන අදාළ ඖෂධ වර්ගයේ විද්‍යාත්මක නාමය හෝ වෙළඳ නාමය නිවැරදිව නොදනී. වෛද්‍ය නිර්දේශයන් ව්‍යාජ ලෙස භාවිතා කරමින් මේවා මිලදී ගන්නා අතර ඒවා සඳහා වෙනත් අන්වර්ථ නාමයන් ඇතැම් විට භාවිතා කරනු ලබයි.

උදා :- නිල්ල සොයා, Apple, Rexta

**පාසල් ළමුන් අතර මත්කාරක ද්‍රව්‍යයන් ව්‍යාප්ත වීම හා සම්බන්ධ ප්‍රවණතා**

මත්කාරක ද්‍රව්‍ය කෙරෙහි ඇබ්බැහි වීම යන සංසිද්ධිය ගැඹුරින් විමර්ශනය කිරීමේදී ඊට යොමු වීමේ අවධානම් කණ්ඩායම් අතුරින් පාසල් යන වයසේ දරුවන් ප්‍රධාන කණ්ඩායමක් ලෙස හඳුනා ගත හැකිය. ඔවුන් පසු කරන වයස් මට්ටම් සහ එම වයස් මට්ටම් අනුව සිදුවන චර්යාත්මක වෙනස්කම් සමඟ මෙවැනි ක්‍රියාවන් අත්හදා බැලීමට යොමු වීම ස්වභාවයකි. අධ්‍යයනය තුළ උක්ත කරුණ සම්බන්ධයෙන්ද අවධානය යොමු කරන ලද අතර එහිදී පාසල් සිසුන් මත්කාරක ද්‍රව්‍ය භාවිතයට යොමුවීම සම්බන්ධ යම් යම් සිද්ධීන් අනාවරණය විය. නමුත් එම සිද්ධීන් වියුක්ත කර ගනිමින් තීරණ ගැනීම හෝ එවැනි සිද්ධීන් සමස්තය උදෙසා සාමාන්‍යකරණය කිරීම නොකළ යුතු තත්ත්වයකි.

අධ්‍යයනය තුළින් අනාවරණය වූ ආකාරයට නගරාසන්න පාසල් වල පිරිමි ළමුන් සුළුතරයක් තුළ මෙවැනි චර්යාවන් සහ සම්බන්ධ සිද්ධීන් වාර්තා වී ඇත. ඒ පිළිබඳව ගැඹුරින් විමසීමේදී තහවුරු වූ කරුණක් නම් බොහෝ ප්‍රදේශ වල පාසල් සිසුන් මත්කාරක දුම් කුඩු විශේෂයන් භාවිතයට යොමු වීම සම්බන්ධ ප්‍රවණතාවක් උද්ගත වෙමින් පවතී. මෙම දුම් කුඩු නිෂ්පාදන නීත්‍යානුකුල අවසරයක් සහිතව නිෂ්පාදනය කරන ලද ඒවා වූ අතර වයස අවුරුදු 21ට අඩු දරුවන් වෙත අලෙවි කිරීම තහනම් වුවත් ඇතැම් ස්ථාන වල පාසල් සිසුන් ඉලක්ක කර ගෙන මෙවැනි ද්‍රව්‍ය අලෙවි කරන අවස්ථා වාර්තා වී ඇත.

නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් සමඟ කරන ලද සම්මුඛ සාකච්ඡා වලින් ලද දත්ත අනුව පෞද්ගලික නිෂ්පාදන ආයතන මඟින් නිෂ්පාදනය කර අලෙවි කරන දුම් කුඩු විශේෂයන්ට අමතරව දුම් කොළ සහ වෙනත් ද්‍රව්‍ය උපයෝගී කර ගනිමින් පාසල් සිසුන් විසින්ම යම් යම් මත්කාරක ද්‍රව්‍ය නිෂ්පාදනය කර ගන්නා අවස්ථාවන්ද වාර්තා වී ඇත. නමුත් එවැනි තත්ත්වයන් සම්බන්ධ සුළු ප්‍රවණතාවක් හඳුනා ගත හැකිය. ඊට අමතරව මාවා වැනි පුවක් විශේෂයක් පාසල් ළමුන් අතර ව්‍යාප්ත වීම සම්බන්ධ සුළු සිද්ධීන් කිහිපයක් යම් යම් නාගරික ප්‍රදේශ ආශ්‍රිතව වාර්තා වී ඇත. එමෙන්ම පාසල් සිසුන් ඇතැම් අවස්ථාවල මද්‍යසාර වර්ග භාවිතා කිරීමට යොමු වූ අවස්ථාවන් සම්බන්ධයෙන් ද අධ්‍යයනය තුළින් අනාවරණය විය. විශේෂයෙන්ම පාසල් අතර ක්‍රීඩා තරග ඉසව් පැවැත්වෙන කාල සීමාවන් තුළ මෙවැනි ක්‍රියාවන්ට යොමු වීමේ වැඩි ප්‍රවණතාවක් පවතින බවටද අනාවරණය විය. සමස්ත පාසල් ශිෂ්‍ය ප්‍රජාව හා සැසඳීමේදී මෙම තත්ත්වය ඉතා සුළු ප්‍රවණතාවක් පවත්නා කරුණක් වුවත් ඒ තුළ ගැබ්ව පවතින අවදානම කෙරෙහි සුවිශේෂී අවධානයක් යොමු විය යුතුය. ප්‍රාථමික මත්ද්‍රව්‍යක් වශයෙන් මෙවැනි ද්‍රව්‍යයන් භාවිතා කිරීම මත්ද්‍රව්‍ය කෙරෙහි දීර්ඝ කාලීනව යොමු වීමේ මූලික අවස්ථාව විය හැකිය.

**මත්ද්‍රව්‍ය දුර්භාවිතය සම්බන්ධ සිද්ධීන් වල ස්ත්‍රී පුරුෂ නියෝජනය**

දිවයිනේ තෝරා ගත් පොලිස් බල ප්‍රදේශ ආශ්‍රයෙන් මත්ද්‍රවය ආශ්‍රිත විවිධ වැරදි සඳහා අත්අඩංගුවට ගැනීම් සම්බන්ධ විවිධ ප්‍රවණතා සම්බන්ධයෙන් අධ්‍යයනය තුළ අවධානය යොමු කරන ලදි. ඒ අතර මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදි සඳහා ස්ත්‍රී හා පුරුෂ වශයෙන් යොමු වීමේ පවත්නා කාලීන තත්ත්වය පිළිබඳ අධ්‍යයනය කරන ලද අතර එහිදී තහවුරු වූ ප්‍රධාන කරුණක් නම් මත්ද්‍රව්‍ය භාවිතා කිරීම සම්බන්ධයෙන් පුරුෂයින්ට සාපේක්ෂව කාන්තාවන් ඉතා සුළු ප්‍රතිශතයක් වාර්තා වී ඇති බවයි. නමුත් මත්ද්‍රව්‍ය අලෙවිය සහ ජාවාරම් කිරීම සම්බන්ධයෙන් සැළකීමේදී කාන්තාවන්ගේ යොමු වීමේ ප්‍රවණතාවක් හඳුනා ගත හැකිවිය. විශේෂයෙන්ම ගංජා, හෙරොයින් සහ නීතිවිරෝධී මද්‍යසාර වීදි මට්ටමේ අලෙවි කිරීම් සම්බන්ධයෙන් කාන්තාවන් වරදකරුවන් වීමේ ප්‍රවණතාවක් පවතී. කොළඹ ඇතුළු නාගරික කලාපයන් තුළ හෙරොයින් සහ ගංජා අලෙවි කිරීම සඳහා කාන්තාවන් යොමු වී සිටින අතර ග්‍රාමීය ප්‍රදේශ ආශ්‍රිතව මෙම තත්ත්වය මදක් වෙනස් ස්වරූපයක් දරයි. එනම් ගංජා හෝ හෙරොයින් වැනි මත්ද්‍රව්‍ය වල ව්‍යාප්තිය අවම මට්ටමක පවතින අවස්ථාවල නීතිවිරෝධී මද්‍යසාර නිෂ්පාදනය හෝ අලෙවි කිරීම සම්බන්ධයෙන් කාන්තාවන් යොමු වූ අවස්ථා වාර්තා වී ඇත.

එමෙන්ම මත්ද්‍රව්‍ය අලෙවි කිරීම සම්බන්ධයෙන් සැළකීමේදී කාන්තාවන් එවැනි ක්‍රියාවන්ට යොමු වීම සඳහා ගෘහස්ථය තුළින් හෝ සමාජයීය පාරිසරික සාධකයන්ගෙන් ප්‍රබල ප්‍රේරණයක් ලැබී ඇති බව තහවුරු විය. අධ්‍යයනය තුළ අනාවරණය වූ දත්ත වලට අනුව කාන්තාවන් මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදි සඳහා යොමු වූ බොහෝ පවුල් ඒකකයන් තුළ ස්වාමිපුරුෂයා හෝ වෙනත් සාමාජිකයෙක් මත්ද්‍රව්‍ය භාවිතයට, නිෂ්පාදනයට හෝ අලෙවිය සඳහා දායකත්වයක් දක්වයි. පවුල් ඒකක වලට පහසුවෙන් හා ක්ෂණිකව ආර්ථිකමය ස්ථාවරභාවයක් ළඟාකර ගැනීම සඳහා මෙවැනි අවදානම් ආදායම් මාර්ග තෝරා ගනු ලබයි.

මත්ද්‍රව්‍ය දුර්භාවිත දත්ත කළමනාකරණ පද්ධතියට (දිවයිනේ මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදි සඳහා අත්අඩංගුවට පත්වන පුද්ගලයින්ගේ දත්ත ඇතුළත් දත්ත ගොනුව) වාර්තා වී ඇති මත්ද්‍රව්‍ය ආශ්‍රිත අත්අඩංගුවට ගැනීම් වලට අදාළ දත්ත අනුව මෙම තත්ත්වය තවදුරටත් පැහැදිලි වෙයි. 2015 වර්ෂයේ ජනවාරි සිට ජුනි දක්වා කාල සීමාව තුළ මත්ද්‍රව්‍ය දුර්භාවිත දත්ත කළමනාකරණ පද්ධතියට වාර්තා වූ මත්ද්‍රව්‍ය ආශ්‍රිත අත්අඩංගුවට ගැනීම් වලට අදාළ දත්ත අනුව කාන්තාවන් 07 දෙනෙක් මත්ද්‍රව්‍ය ආශ්‍රිත විවිධ වැරදි සඳහා අත්අඩංගුවට ගෙන ඇත. ඒ අතුරින් කාන්තාවන් 04 දෙනෙක් මත්ද්‍රව්‍ය අලෙවිය හෝ ජාවාරම් කිරීම සම්බන්ධ වැරදි සඳහා අත්අඩංගුවට පත්ව ඇත.

මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදි සඳහා අත්අඩංගුවට පත්වන පුද්ගලයින් සම්බන්ධයෙන් හඳුනා ගත හැකි තවත් ප්‍රවණතාවක් වන්නේ, එකම වරද සම්බන්ධයෙන් කිහිපවරක් නීතියේ රැහැනට හසුවීමයි. නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන්ගේ අත්දැකීම් වලට අනුව බොහෝවිට ගංජා, හෙරොයින් වැනි මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් බොහෝ පුද්ගලයින් නැවත නැවතත් අත්අඩංගුවට පත්වීමේ තත්ත්වයක් පවතින බව අනාවරණය විය.

## නිගමන

- අන්තරායකර ඖෂධ ගණයට ගැනෙන මත්කාරක ද්‍රව්‍ය භාවිතා කරන පුද්ගලයින්ගේ මත්ද්‍රව්‍ය භාවිත රටාඅනුව බහුතරයක් පිරිස බහුවිධ මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන් (Multiple drug users) බව නිගමනය කළ හැකිය.

- යම් පුද්ගලයෙක් මත්ද්‍රව්‍ය භාවිතයට මුලින්ම යොමු වන වයස් සීමාව පිළිබඳව සැළකීමේදී බහුතරයක් පුද්ගලයින් වයස අවුරුදු 15ත් 19ත් අතර වයස් මට්ටමකදී ප්‍රථම වරට යම් මත්ද්‍රව්‍යයක් භාවිතා කිරීම සිදු කර ඇති අතර වයස අවුරුදු 14 හෝ ඊට අඩු වයස් මට්ටමකදීද පුද්ගලයින් ප්‍රථම වරට මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවූ අවස්ථා ඇත. මත්ද්‍රව්‍ය භාවිතය සඳහා යොමු වීමට බලපාන ලද හේතූන් පිළිබඳව විමසීමේදී, එය පුළුල් වූ පරාසයක් තුළ විහිද පවතින්නක් වන අතර බහුතරයක් මිතුරු බලපෑම (Peer Presure) මත සහ සතුට හා විනෝදය පිණිස පළමු වරට මත්ද්‍රව්‍ය භාවිතය සඳහා යොමු වී ඇත.
- හෙරොයින් භාවිතා කරන ජනගහනය අතර මත්ද්‍රව්‍ය ශරීරගත කර ගන්නා ප්‍රචලිත ක්‍රමය බවට පත්ව ඇත්තේ, චයිනීස් (chase to the Dragon) ක්‍රමයයි. ඊට අමතරව එන්නත් කිරීමේ ක්‍රමය සහ නාසයෙන් ඉරීමේ ක්‍රමය ද භාවිතා කරනු ලබයි. චයිනීස් ක්‍රමය මඟින් දිනපතා හෙරොයින් භාවිතා කරන පුද්ගලයින් දිනකට හෙරොයින් භාවිතා කරන සාමාන්‍ය වාර ගණන 03 ක් වන අතර හෙරොයින් භාවිතා කරන පුද්ගලයෙක් දිනකට භාවිතා කරන සාමාන්‍ය හෙරොයින් පැකට් ගණන 03 කි. යම් පුද්ගලයෙක් එක් වරකදී භාවිතා කරනු ලබන හෙරොයින් පැකට් එකක අන්තර්ගත හෙරොයින් ප්‍රමාණය දළ වශයෙන් 20mg කි. වීදි මට්ටමේ අලෙවි කරනු ලබන හෙරොයින් පැකට් එකක මිලෙහි සාමාන්‍ය රු: 1025.00 කි.

- හෙරොයින් නොමැති අවස්ථාවල භාවිතා කරන විකල්ප ද්‍රව්‍ය අතරින් Morphine පෙති බහුතරයක් විසින් භාවිතා කරනු ලැබ ඇත. ඊට අමතරව Tramadol, Rohypnol, Diazepam, Artane සහ pregaballin වැනි පෙති වර්ගයන් ද හෙරොයින් වලට විකල්ප ද්‍රව්‍යයන් ලෙස භාවිතා කරනු ලබයි.

- ගංජා දිනපතා භාවිතා කරන පුද්ගලයෙක් දිනකට භාවිතා කරනු ලබන සාමාන්‍ය ගංජා පැකට් ගණන එකකි. එනම් බහුතර පිරිසක් දිනකට පැකට් එකක් භාවිතා කරන අතර මෙහිදී පැකට් එකක් යන්න භාවිතා කිරීමේ පහසුව සඳහා සහ දෛනිකව පහසුවෙන් අලෙවි කිරීමේ හා හුවමාරු කර ගැනීමේ පහසුව පිළිබඳ සලකමින් සකසන ලද ප්‍රමාණයකි. භාවිතා කිරීම සඳහා ලබා ගන්නා ගංජා කොටසක මිල රු. 200 - 300 අතර මිලක් විය.

- හෙරොයින් වැනි මාදක ගණයේ මත්කාරක ද්‍රව්‍ය භාවිතයට යොමු වූ පුද්ගලයින් එයට අමතර හෝ විකල්පයන් ලෙස ඖෂධ වර්ග අනිසි ලෙස භාවිතා කිරීම සම්බන්ධ ප්‍රවණතාවක් නිර්මාණය වෙමින් පවතියි. වෛද්‍යවරයෙකු විසින් නිර්දේශ කරන ලද ඖෂධ වට්ටෝරු අයුතු ලෙස භාවිතා කරමින් ඖෂධ සැල් වලින් ඖෂධ ලබා ගන්නා අතර අනෙක් ක්‍රමය නම් සමහර ඖෂධ සැල් හිමියන් සමඟ පෞද්ගලිකව ගොඩනගා ගත් සම්බන්ධතාවයන් මත වෛද්‍ය නිර්දේශයකින් තොරව අදාළ ඖෂධ ලබා ගනියි.

- වෛද්‍යමය නිර්දේශයන් මත නිකුත් කරනු ලබන ඖෂධ වර්ග සහ අනෙකුත් ඖෂධ වර්ග සම්බන්ධයෙන් තාක්ෂණික සහ නෛතික දැනුම ප්‍රමාණවත් නොවීම සහ වෛද්‍යමය අරමුණු සඳහා භාවිතා කරන ඖෂධ අවභාවිතා කිරීමේ සිද්ධීන් සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කිරීමේදී නෛතික කාර්යය පටිපාටිය තුළ ප්‍රායෝගික දුෂ්කරතාවයන් මතුවීම නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් මුහුණපාන ප්‍රධාන ගැටලු දෙකකි.
- පාසල් සිසුන් මත්කාරක ද්‍රව්‍ය භාවිතයට යොමුවීම සම්බන්ධ යම් යම් සිද්ධීන් අනාවරණය වී ඇති අතර එය සමස්ත පාසල් ප්‍රජාව හා සැසඳීමේදී ඉතා අඩු ප්‍රවණතාවක් ලෙස සැළකිය හැකිය. නමුත් එම තත්ත්වය නොසළකා හැරිය නොහැකි අතර එහි පවත්නා අවදානම පිළිබඳ අවධානය යොමු කළ යුතුය.

- මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදි සඳහා ස්ත්‍රී හා පුරුෂ වශයෙන් යොමු වීමේ පවත්නා කාලීන තත්ත්වය පිළිබඳ සැළකීමේදී තහවුරු වූ ප්‍රධාන කරුණක් නම් මත්ද්‍රව්‍ය භාවිතා කිරීම සම්බන්ධයෙන් පුරුෂයින්ට සාපේක්ෂව කාන්තාවන් ඉතා සුළු ප්‍රතිශතයක් වාර්තා වී ඇති බවයි. නමුත් මත්ද්‍රව්‍ය අලෙවිය සහ ජාවාරම් කිරීම සම්බන්ධයෙන් සැළකීමේදී කාන්තාවන්ගේ යොමු වීමේ ප්‍රවණතාවක් හඳුනා ගත හැකිවිය.

## යෝජනා

- පාසල් සිසුන් මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවීම වළක්වා ගැනීම සඳහාවූ නිවාරණ ක්‍රියාවලිය තවදුරටත් පුළුල් කළ යුතුය. එහිදී මත්ද්‍රව්‍ය වෙනුවට වෙනත් ආදේශකයන් භාවිතයට යොමුවීමේ ප්‍රවණතාවක් ඇති බැවින් නිවාරණයේදී ඒ සම්බන්ධ ආකල්පයන් වෙනස් කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය.
- කාන්තාවන් මත්ද්‍රව්‍ය අලෙවිය සම්බන්ධයෙන් දක්වන දායකත්වය අවම කරගැනීම සඳහා කාන්තාවන් වෙනුවෙන් සුවිශේෂී දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුය.
- ඖෂධ අනිසි භාවිතය සම්බන්ධයෙන් විශේෂයෙන් අලුතින් වෙළඳපොළට නිකුත් වන ඖෂධ වර්ග ඒවායේ බලපෑම්, අයත් කාණ්ඩයන් පිළිබඳව නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් උදෙසා තවදුරටත් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතය.
- ඖෂධ අනිසි භාවිතය සම්බන්ධයෙන් පවත්නා නෛතික රාමුව නව්‍යකරණයට ලක්කිරීමේ කාලීන අවශ්‍යයතාවයක් පවතින අතර ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතය.

## ආශ්‍රිත ග්‍රන්ථ


අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය.2015.*ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය දුර්භාවිත තොරතුරු අත්පොත 2015.* අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය.2016.*ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය දුර්භාවිත තොරතුරු අත්පොත 2016.* අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය

එක්සත් ජාතීන්ගේ සංවිධානය.2015.*ලෝක මත්ද්‍රව්‍ය වාර්තාව.* නිව්යෝර්ක්.එක්සත් ජාතීන් සංවිධානය

Bulletin on Narcotics vol LIV.2002.The Science of drug abuse epidemiology.Newyork.United Nations.